
# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# ANNUAL REPORT
# 2020














ජාතික ගමනාගමන කොමිෂන් සභාව
தேசிய போக்குவரத்து ஆணைக்குழு
NATIONAL TRANSPORT COMMISSION

# ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ජාගකොස)

**ලිපිනය**

241, උද්‍යාන පාර,

කොළඹ 05.

**වෙබ් අඩවිය**

www.ntc.gov.lk

**විද්‍යුත් තැපැල**

info@ntc.gov.lk

**ක්ෂණික ඇමතුම්**

1955

NTC/PL/ Annual Report / 2020 2021.02.08

ගරු ප්‍රවාහන අමාත්‍ය,
ප්‍රවාහන අමාත්‍යාංශය,
7 වන මහල,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල.

**වාර්ෂික වාර්තාව - 2020**

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) වගන්තිය හා රාජ්‍ය ව්‍යාපාර යහපාලනය සඳහා වූ උපදෙස් මාලාවේ අංක 05 හා 06 පරිච්ඡේද අනුව සකස් කරන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව, වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාව ඉතාමත් සතුටින් ඉදිරිපත් කරමි.

ශශී වෙල්ගම
සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

# පටුන


| පරිච්ඡේදය | පිටුව |
|---|---|
| කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය | 1 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 5 |
| දළ විශ්ලේෂණය | 6 |
| අපගේ අරමුණු / පරමාර්ථ | 7 |
| කොමිෂන් සභාවේ සංයුතිය | 8 |
| 2020 වර්ෂයේ කාර්යසාධන | 9 |
| 1. සාමාජයීය සුභසාධනය ප්‍රමුඛ කොටගත් බස්රථ සේවා සැපයීම | 9 |
| 1.1 පාසල් බස්රථ සේවා ව්‍යාපෘතිය - 'සිසු සැරිය' | 9 |
| 1.2 ග්‍රාමීය බස්රථ සේවා ව්‍යාපෘතිය- "ගැමි සැරිය" | 11 |
| 1.3 රාත්‍රී බස්සේවා ව්‍යාපෘතිය - "නිසි සැරිය" | 12 |
| 2. බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම | 13 |
| 3. ප්‍රවාහන ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ | 14 |
| 4. දුරගමන් සේවා සංඥා පුවරු | 15 |
| 5. කාලසටහන් පිළියෙල කිරීම හා සංශෝධනය කිරීම | 16 |
| 6. බස් ගාස්තු විෂමතා ඉවත් කිරීම | 16 |
| 7. ප්‍රවාහනය සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 17 |
| 8. තොරතුරු තාක්ෂණ පද්ධතිය | 18 |
| 8.1 ආයතනික ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය | 18 |
| 8.2 ගූගල් තාක්ෂණය ඔස්සේ පොදු ප්‍රවාහන සේවා හඳුනාගැනීම (GTFS) | 19 |
| 8.3. MyBus-SL Application එළිදැක්වීම | 19 |
| 8.4. බස්රථ සඳහා GPS සවිකිරීම | 20 |
| 9. පෙරගෙවුම් කාඩ් ක්‍රමය (Electronic Fare Collection) | 20 |
| 10. මහජන පැමිණිලි | 20 |
| 11. ආයතනික ප්‍රතිසංස්කරණ හා යටිතල පහසුකම් සංවර්ධනය | 22 |
| 11.1 බස් නැවතුම්පළ ඉදිකිරීම හා නවීකරණය | 22 |
| 11.2 ජා.ග.කො.ස. ගොඩනැගිලි අලුත්වැඩියාව | 22 |
| 11.3 විදුලි බලය පිරිමැසීම සඳහා ආයතනය තුළ විකල්ප බලශක්ති උත්පාදනය (සූර්ය කෝෂ) | 23 |
| 12. අන්තර් පළාත් මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම | 23 |
| 13. ජංගම පරීක්ෂණ හා විමර්ශනය | 23 |
| 14. ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව | 24 |
| 15. සේවක පුහුණුව හා සංවර්ධනය | 24 |
| 16. කොවිඩ් 19 වසංගත කාලය තුළ සිදු කරන ලද කාර්යයන් | 24 |
| වාර්ෂික ගිණුම් | 27 |
| විගණකාධිපති වාර්තාව | 43 |
| විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු | 52 |

# කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය

## 2020 පෙබරවාරි සිට 2020 මැයි දක්වා

| | | |
|---|---|---|
| 1. | ශශී වෙල්ගම මහතා | - සභාපති |
| 2. | ඩී.සී.ඩබ්. හපුගොඩ මහත්මිය | - සාමාජික (නිලබලයෙන්) |
| 3. | එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මහතා | - සාමාජික |
| 4. | එස්.ආර්. ගොඩමුණේ මහතා | - සාමාජික |
| 5. | එස්. ජලදීපන් මහත්මිය | - සාමාජික (නිලබලයෙන්) |
| 6. | එන්.වී.එන්.ඩී. ජයවර්ධන මහත්මිය | - සාමාජික (නිලබලයෙන්) |
| 7. | කේ. බුද්ධදාස මහතා | - සාමාජික |

## 2020 ජූනි සිට 2020 අගෝස්තු දක්වා

| | | |
|---|---|---|
| 1. | ශශී වෙල්ගම මහතා | -සභාපති |
| 2. | ඩී.සී.ඩබ්. හපුගොඩ මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 3. | එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මහතා | -සාමාජික |
| 4. | එස්.ආර්. ගොඩමුණේ මහතා | -සාමාජික |
| 5. | එස්. ජලදීපන් මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 6. | එන්.වී.එන්.ඩී. ජයවර්ධන මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 7. | කේ. බුද්ධදාස මහතා | -සාමාජික |
| 8. | එම්. චන්ද්‍රසිරි මහතා | -සාමාජික |

## 2020 සැප්තැම්බර් සිට 2020 ඔක්තොම්බර් දක්වා

| | | |
|---|---|---|
| 1. | ශශී වෙල්ගම මහතා | -සභාපති |
| 2. | ඩී.සී.ඩබ්. හපුගොඩ මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 3. | එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මහතා | -සාමාජික |
| 4. | එස්.ආර්. ගොඩමුණේ මහතා | -සාමාජික |
| 5. | එස්. ජලදීපන් මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 6. | එන්.වී.එන්.ඩී. ජයවර්ධන මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 7. | කේ. බුද්ධදාස මහතා | -සාමාජික |

## 2020 නොවැම්බර් මාසය තුළ

| | | |
|---|---|---|
| 1. | ශශී වෙල්ගම මහතා | -සභාපති |
| 2. | ඩී.සී.ඩබ්. හපුගොඩ මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 3. | එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මහතා | -සාමාජික |
| 4. | එස්.ආර්. ගොඩමුණේ මහතා | -සාමාජික |
| 5. | එස්. ජලදීපන් මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 6. | ඒ.එම්.ආර්.ජේ.කේ. ජයසිංහ මහතා | -සාමාජික (නිලබලයෙන්) |
| 7. | කේ. බුද්ධදාස මහතා | -සාමාජික |

## 2020 දෙසැම්බර් 31 දක්වා

| | | |
|---|---|---|
| 1. | ශශී වෙල්ගම මහතා | -සභාපති |
| 2. | ඩී.සී.ඩබ්. හපුගොඩ මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 3. | එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මහතා | -සාමාජික |
| 4. | එස්.ආර්. ගොඩමුණේ මහතා | -සාමාජික |
| 5. | එස්. ජලදීපන් මහත්මිය | -සාමාජික (නිලබලයෙන්) |
| 6. | ඒ.එම්.ආර්.ජේ.කේ. ජයසිංහ මහතා | -සාමාජික (නිලබලයෙන්) |
| 7. | කේ. බුද්ධදාස මහතා | -සාමාජික |
| 8. | බී.ඒ.ඩී.ඒ. සම්පත් රණසිංහ මහතා | -සාමාජික |

## මාණ්ඩලික රැස්වීම් හා විගණන හා කළමනාකරණ රැස්වීම්

| | |
|---|---|
| 2020 වර්ෂය තුළ පවත්වනු ලැබූ කොමිෂන් සභා රැස්වීම් සංඛ්‍යාව | 13 |
| 2020 වර්ෂය තුළදී පවත්වනු ලැබූ විගණන හා කළමනාකරණ රැස්වීම් සංඛ්‍යාව | 03 |

# සභාපතිතුමාගේ පණිවුඩය



අතිගරු ජනාධිපතිතුමාගේ රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව ශ්‍රී ලාංකික ජනතාවට කාර්යක්ෂම, ඉහළ ප්‍රමිතියකින් යුත් පරිසර හිතකාමී, සුවපහසු ප්‍රවාහන සේවාවක් ලබාදීම සඳහා ප්‍රවාහනයට නූතන ප්‍රවේශයක් ඇති කරනු වස් 2020 වර්ෂයේ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

පාසල් ශිෂ්‍යයන්ට සහ ගුරුවරුන්ට නිසි කළමනාකරණයකින් යුතු පාසල් ප්‍රවාහන සේවයක් රාජ්‍ය හා පෞද්ගලික අංශය ඒකාබද්ධව සකස් කිරීම, මහාමාර්ග සහ දුම්රිය මාර්ග පදනම් කරගත් ප්‍රවාහන පද්ධතියේ ඇති පසුගාමීත්වය සහ බිඳුනු අන්තර් සම්බන්ධතාවය නැවත ඇති කිරීම, ගමනාගමන මණ්ඩලය සහ පෞද්ගලික බස්රථ ඒකාබද්ධව තරඟකාරිත්වයකින් තොරව සාධාරණව ආදායම් උපයා ගත හැකි වන ලෙස සහ සාමාන්‍ය ජනතාවට අපහසුතාවයක් ඇති නොවන ලෙස පොදු කාලසටහනක් යටතේ සෑම මාර්ගයකම දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක වන බස් සේවාවක් ලබා දීම, ඕනෑම බස්රථයක භාවිතා කළහැකි ඊ - ප්‍රවේශපත්‍ර ක්‍රමයක් (E – Ticketing System) හඳුන්වා දීම, මාර්ග තදබදය සහ අනතුරු වලට ප්‍රධාන හේතුවක් වී තිබෙන රියැදුරන්ගේ වගකීමෙන් තොර රිය ධාවනය වෙනුවට විනයගරුක රිය ධාවනයට යොමු කිරීම සඳහා ඔවුන්ගේ ආකල්ප හා හැසිරීම් වෙනස් කිරීමට අවශ්‍ය දැනුම හා පුහුණුව ලබා දීම සඳහාත් මෙම වසරේ විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව සිසු සැරිය ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාම හා දරුවන් අතර මෙම බස්රථ සේවාව ප්‍රචලිත කිරීම, පෞද්ගලික හා ලංගම බස් රථ සඳහා ඒකාබද්ධ කාල සටහන් සකස් කිරීම හා දුම්රිය සේවය සමග ඒකාබද්ධ බස් රථ සේවා ආරම්භ කිරීම , රියදුරු පුහුණු වැඩසටහන් නව මුහුණුවරකින් ක්‍රියාත්මක කිරීම, පොදු ප්‍රවාහන බස් රථ සඳහා පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමත් ඉන් ප්‍රධාන ස්ථානයක් ගනු ලැබිණ. මීට අමතරව ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා ගැමි සැරිය, නිසි සැරිය ව්‍යාපෘති අඛණ්ඩව පවත්වා ගෙන යාම, පොදු ප්‍රවාහනය භාවිතා කරන මගීන්ට සුව පහසු ගමනක් - පරිසර හිතකාමී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා නවීන තාක්ෂණය පොදු ප්‍රවාහනයට හඳුන්වා දීම සඳහා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

නමුත් 2020 වර්ෂයේ මාර්තු මස ආරම්භ වූ කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතු කොට ගෙන සැලසුම් කළ ව්‍යාපෘති රැසක් බලාපොරොත්තු වූ ඉලක්කය කරා යාමට නොහැකි වුවද මුහුණ දීමට සිදු වූ සියළු අභියෝග යටතේ සැලසුම් කල ව්‍යාපෘති සැලකිය යුතු මට්ටමකින් සාර්ථක කර ගැනීමට සහාය වූ ගරු ප්‍රවාහන අමාත්‍යතුමාටත්, ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමාටත්, ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් ඒ සඳහා සහයවූ ප්‍රවාහන අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ටත් , ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ සමස්ථ කාර්යමණ්ඩලයටත් පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිවල සභාපතිතුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩල වලටත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු නිලධාරී මණ්ඩලයටත් සියළුම බස්රථ හිමියන්ටත් නන් අයුරින් සහයෝගය දක්වන ලද සියළු පාර්ශවයන්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය ප්‍රකාශ කර සිටිමි.

**ශශී වෙල්ගම**
**සභාපති,**
**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**

## දළ විශ්ලේෂණය

### ජාතික ගමනාගමන කොමිෂන් සභාව



**අපගේ දැක්ම...**

දිවයින තුළ සමාජ-ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීම සඳහා ගුණාත්මක, පිරිවැය ඵලදායී සහ ආරක්ෂාකාරී ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් හා සේවාවක් මගින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගේම විවිධ ගමනාගමන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සහතිකවීම.

**අපගේ මෙහෙවර...**

මගී ප්‍රවාහනයට අදාල ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් දීම සහ පොදුජන ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම බස් ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා අවශ්‍ය නියාමන රාමුවක් සකස්කිරීම.

## අපගේ අරමුණු / පරමාර්ථ

- බස් සේවා සංවර්ධන කාර්යයන් ගුණාත්මකව මෙන්ම ප්‍රමාණාත්මකව ඉතා උසස් මට්ටමකින් අඛණ්ඩව පවත්වාගෙන යාම.

- කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් වර්ධනය කිරීම.

- තමන්ට වඩාත් සුදුසු බස් සේවයක් තෝරාගැනීමට මගීන්ට අවස්ථාව සැලසෙන ප්‍රවාහන පද්ධතියක් වර්ධනය කිරීම.

- මගී ප්‍රවාහන සේවාවන්හි නියැලි මෙහෙයුම්කරුවන්ගේ ස්ථාවරත්වය හා පැවැත්ම පිළිබඳව සහතික වීම.

- ග්‍රාමීය හා සංවර්ධනය වෙමින් පවත්නා ප්‍රදේශවල ක්‍රියාත්මක වන අඩු ප්‍රතිලාභ ලබන එහෙත් සමාජ අවශ්‍යතාවයන් අනුව අත්‍යවශ්‍ය වන බස් සේවාවන් සඳහා මූල්‍ය ආධාර ලබාදීම.

- මගී ප්‍රවාහන බස් සේවාවන් මගින් ඇතිවන පරිසර හානිය වැළැක්වීම සඳහා ක්‍රමවේදයක් සැලසුම්කොට වර්ධනය කිරීම.

- බස්රථවල ධාවන කාලයන් විධිමත් කිරීමෙන් බස්රථවල ඵලදායිතාවය වැඩිකිරීම.

- බස්රථ ධාවන කටයුතුවල ආරක්ෂාකාරී බව සහ විනය ගරුක බව තහවුරු කිරීම.

- අන්තර් පළාත් සහ පළාත්බද යන අංශ දෙකෙහිම බස් ප්‍රවාහන ක්‍රම සම්බන්ධීකරණය කිරීම.

- රටේ සමස්ත ශ්‍රම ඵලදායිතාවය වැඩිදියුණු කිරීම.

# කොමිෂන් සභාවේ සංයුතිය


නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තවත් සාමාජිකයින් පස් දෙනෙකුගෙන්ද කොමිෂන් සභාව සමන්විත වේ. කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් සහ සැලසුම්, ධාවන හා සේවා අධීක්ෂණ, තත්ත්ව ආරක්ෂණ සහ බාහිර සම්බන්ධතා, මුදල් හා ප්‍රසම්පාදන යන දෙපාර්තමේන්තු 04 භාරව ක්‍රියාකරනු ලබන අධ්‍යක්ෂකවරුන් හතරදෙනෙකුගෙන් සමන්විත වේ.

2020 වර්ෂය අවසාන වනවිට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 219 ක් වු අතර සේවයේ යෙදී සිටි ස්ථිර සේවක සංඛ්‍යාව 184 ක් විය.

**2020.12.31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව**

| අනු අංකය | තනතුරු නාමය | සේවක කාණ්ඩය | අනුමත කාර්යමණ්ඩලය | 2020.12.31 දිනට සේවයේ යෙදී සිටි කාර්යමණ්ඩලය |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | HM 2 -1 | 01 | 01 |
| 02 | අධ්‍යක්ෂ | HM 1-1 | 04 | 04 |
| 03 | සහකාර අධ්‍යක්ෂ | MM 1-1 | 17 | 11 |
| 04 | කණිෂ්ඨ කළමනාකාර | JM 1-1 | 21 | 20 |
| 05 | කළමනාකරණ සහකාර | MA 4 | 36 | 33 |
| 06 | කළමනාකරණ සහකාර | MA 2-1 | 03 | 01 |
| 07 | කළමනාකරණ සහකාර | MA 1-1 | 76 | 69 |
| 08 | රියැදුරු | PL 3 | 13 | 14 |
| 09 | කාර්යාල කාර්ය සහායක | PL 1 | 12 | 12 |
| 10 | වේලා සටහන්කරු | PL 1 | 33 | 18 |
| 11 | කම්කරු | PL 1 | 03 | 01 |
| | **එකතුව** | | **219** | **184** |

මූලාශ්‍රය - පාලන දෙපාර්තමේන්තුව, ජාගකොස



# 2020 වර්ෂයේ කාර්යසාධන

## 1. සාමාජයීය සුභසාධනය ප්‍රමුඛ කොටගත් බස්රථ සේවා සැපයීම

මහජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණයට සහ තත්ත්වයට බස්රථ මගින් මගී ප්‍රවාහනයට අදාළ සේවාවන් දියුණු තත්ත්වයට නංවාලීම සහ එම සේවාවන් ශ්‍රී ලංකාව මුළුල්ලෙහිම සාධාරණ ලෙස ව්‍යාප්ත කිරීමත්;

සමාජයීය වශයෙන් අවශ්‍ය එහෙත් ලාභ නොලබන මාර්ග සේවා සහ ගමන්වාරවල, බස්රථ මගින් මගී ප්‍රවාහනයට අදාළ ප්‍රමාණවත් සේවාවන් මෙහෙයවීම සඳහා විධිවිධාන සැලැස්වීමත්;

එම සේවා සපයන්නන් අතර යහපත් තරඟයක් ඇතිකර අසාධාරණ සහ ලාභ නොලබන තරඟකාරීකත්වය වැලැක්වීම; යන ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ ජාතික ගමනාගමන කොමිෂන් සභාව පිහිටුවා ඇත.

ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව සාමාජයීය වශයෙන් අවශ්‍ය බස්රථ සේවා සැපයීම සඳහා “සිසුසැරිය” “ගැමි සැරිය” “නිසි සැරිය” යන ව්‍යාපෘති ආරම්භ කර ඇත. මේ සඳහා 2020 වර්ෂයේ රජය විසින් රුපියල් මිලියන 650.0ක් වෙන් කරන ලදී.

### 1.1 පාසල් බස්රථ සේවා ව්‍යාපෘතිය - ‘සිසු සැරිය’



පාසල් දරුවන්ට මානසික හෝ ශාරීරික අපහසුතාවයකින් තොරව කලට වේලාවට පාසල් වෙත පැමිණීමටත් අධ්‍යාපන කටයුතු නිමාකොට ආරක්ෂිතව නිවස කරා ගමන්කිරීමටත් සහන ගාස්තු ක්‍රමයක් යටතේ වඩාත් විශ්වාසනීය වූ, ආරක්ෂා සහිත පාසල් දරුවන්ටම වෙන්වූ පාසල් බස්රථ සේවාවක් සැපයීම සඳහා 2005 වර්ෂයේදී “සිසුසැරිය” පාසැල් බස්රථ ව්‍යාපෘතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංගම සහ පෞද්ගලික බස්රථ මගින් සිසුන් ප්‍රවාහනය කිරීම සිදු කරන අතර මෙම බස්රථ වලින් ගමන්ගන්නා පාසල් දරුවන්ගෙන් සාමාන්‍ය බස්ගාස්තුවෙන් අඩක් පමණක් අයකිරීම (ශ්‍රී ලංගම බස්රථ වල වාර ප්‍රවේශ පත්‍ර වලින් ගමන් පහසුකම් සකසා ගත හැකිවීම) මෙම ව්‍යාපෘතියේ විශේෂයත්වයක් වන අතර එමගින් ධාවකයාට වන මූල්‍යමය හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා පාසල් දරුවන් රැගෙන ධාවනය වන කි.මී. 01කට රු.57.00

බැගින් උපරිම කි.මී. 110 (ගමන්වාර දෙක සඳහා) රජය විසින් ගෙවීම් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 31 දින වන විට සිසු සැරිය ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා පාසල් බස්රථ 1419 ක් ක්‍රියාත්මක වූ අතර අතිගරු ජනාධිපතිතුමාගේ රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව පාසල් ශිෂ්‍යයින්ට සහ ගුරුවරුන්ට නිසි කළමණාකරණයකින් යුත් පාසල් ප්‍රවාහන සේවයක් රජය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධව සකස් කිරීම සඳහා 2020 වර්ෂයේ නව සිසුසැරිය බස්රථ සේවා 100ක් ආරම්භ කිරීමටත්, මෙම සිසුසැරිය සේවාව මහජනයා අතර වඩාත් ප්‍රචලිත කිරීම සඳහා සිසු සැරිය පමණක් ධාවනය වන බස්රථ කහ වර්ණය ආලේප කිරීමටත් මෙම සේවාවට අදාල බස්රථ මාර්ගයේ ගමන්කිරීමේදී විශේෂත්වයක් ඇතිකිරීම සඳහා සිසු සැරිය ලාංඡනය සමග “මෙම බස්රථයේ පාසල් දරුවන් ගමන් කරයි“ ලෙස සඳහන් කර ස්ටිකරයක් බස් රථයේ ඇලවීමට /සවිකිරීමට සැලසුම් කරන ලදී.






2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 616.97 ක් රජය විසින් වෙන් කළ අතර මාර්තු මස ආරම්භ වූ කොවිඩ් -19 වසංගතය හේතු කොටගෙන අඛණ්ඩව පාසල් නොපැවැත්වීම නිසා සහ පොදු ප්‍රවාහන බස්රථ වලින් දරුවන් පාසල් කරා ගමන් කරවීමට දෙමාපියන් නොපෙළඹීම නිසා 2020 වර්ෂයේ ඉලක්ක කළ බස්රථ සංඛ්‍යාවෙන් ආරම්භ කිරීමට හැකි වූයේ නව සේවා 49 ක් පමණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ 2020 වර්ෂය සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 385.57ක් විය. තවද 2020 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට සියලුම සිසුසැරිය බස්රථ වල සිසු සැරිය ලාංඡනය සමග “මෙම බස්රථයේ පාසල් දරුවන් ගමන් කරයි” ලෙස සඳහන් කර ස්ටිකරය ඇලවීම සිදු කර අවසන් කරන ලදී.

2020 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට වලංගු සිසු සැරිය සේවා පහත වගුවෙහි දැක්වේ.

| පළාත | ‘සිසු සැරිය’ බස් සේවා සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 426 |
| දකුණ | 107 |
| වයඹ | 321 |
| උතුරු මැද | 168 |
| සබරගමුව | 122 |
| ඌව | 111 |
| නැගෙනහිර | 117 |
| මධ්‍යම | 53 |
| උතුර | 36 |
| අන්තර් පළාත් | 7 |
| **එකතුව** | **1468** |

මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස

මීට අමතරව කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතු කොටගෙන දරුවන් සෞඛ්‍යාරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා උපදෙස් ලබාදීම, සෞඛ්‍යාරක්ෂිතව බස්රථ වල ආසන සංඛ්‍යාවට පමණක් දරුවන් රැගෙන යාම සඳහා මෙම බස්රථ වලින් අතිරේක ගමන් වාර සැපයීමද සිදු කරන ලදී. පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව හා අ.පො.ස.උසස් පෙළ විභාග පැවති කාලසීමාව තුළ දරුවන් ප්‍රවාහනය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමද මෙම ව්‍යාපෘතිය යටතේ ධාවනය වන ශ්‍රී ලංගම සහ පෞද්ගලික බස්රථ මගින් සිදුකරන ලදී.

### 1.2 ග්‍රාමීය බස්රථ සේවා ව්‍යාපෘතිය- "ගැමි සැරිය"

කිසිදු බස්රථ සේවාවක් ක්‍රියාත්මක නොවන, සමාජීය වශයෙන් බස්රථ සේවාවක් අවශ්‍ය වුවද ලාභ නොලබන මාර්ග බැවින් මගී ප්‍රවාහනය සඳහා ධාවකයින් ඉදිරිපත් නොවන ග්‍රාමීය ප්‍රදේශ වල වෙසෙන ජනතාවට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් "ගැමිසැරිය" ව්‍යාපෘතිය 2005 වර්ෂයේදී ආරම්භ කර ඇත.



ගැමිසැරිය බස්රථ සේවාව සඳහා ධාවකයින් තෝරාගැනීම විවෘත ටෙන්ඩර් පරිපාටියක් යටතේ සිදු කරන අතර එහිදී කි.මී. එකකට රු.38 උපරිම සහනාධාරයක් ගෙවීමේ පදනම මත කි.මී. 01 අඩුම ලංසුවක් ඉදිරිපත් කරන ධාවකයා තොරාගනී. එසේ තොරාගන්නා ධාවකයාට අදාළ ප්‍රවාහන අධිකාරිය මගින් ග්‍රාමීය මාර්ගයේ මගී ප්‍රවාහනයට මගීසේවා අවසරපත්‍රයක් නිකුත් කරන අතර, එම මගීසේවා අවසර පත්‍රය සහ පළාත් ප්‍රවාහන අධිකාරියේ නිර්දේශය මත ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අදාළ බස්රථ හිමියා ගැමිසැරිය ව්‍යාපෘතියට ඇතුලත් කර ගිවිසුම් අත්සන් කරනු ලැබේ. මෙම ගිවිසුම අනුව සහනාධාර මුදල් උපරිම වසර තුනක් සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබේ. වසර තුනකින් පසු එම මාර්ගය ආර්ථික වශයෙන් ලාභදායී මාර්ගයක් විය හැකි බැවින් සහනාධාර ගෙවීම් අත්හිටුවනු ලැබේ. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද ගැමිසැරිය සේවා රැසක් මේ වන විට ආර්ථික වශයෙන් ලාභදායී ලෙස ග්‍රාමීය ජනතාවට සේවා සපයමින් ක්‍රියාත්මක වේ.

2019 දෙසැම්බර් 31 දින වන විට ගැමි සැරිය ව්‍යාපෘතිය යටතේ ගෙවීම් කරන ගැමි සැරිය සේවා 16 ක් ක්‍රියාත්මක වූ අතර රට හදන සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය යටතේ නව ගැමිසැරිය සේවා 20 ක් ආරම්භ කිරීමට සැලසුම් කළ අතර ඒ සඳහා රු.මි.8.16ක් වෙන්කරන ලදී. නමුත් කොවිඩ්-19 වසංගතය හේතු කොට ගෙන නව මාර්ග හඳුනා ගැනීමේ සමීක්ෂණ සිදු කිරීමට නොහැකි වීම මත නව සේවා ආරම්භ කිරීමට

නොහැකි වූ අතර නව සේවා ආරම්භ කිරීම සඳහා නව මාර්ග පිළිබඳ තොරතුරු පළාත් ප්‍රවාහන අධිකාරී මගින් ලබා ගැනීම සිදු කරන ලදී. ඒ අනුව මේ වන විට සබරගමුව, ඌව, නැගෙනහිර පළාත් වලින් නව ගැමිසැරිය බස්රථ සේවා ආරම්භ කිරීම සඳහා මාර්ග 21ක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

2020.12..31 වන විට සහනාධාර ලබමින් ක්‍රියාත්මක වන ගැමි සැරිය සේවා පහත වගුවෙහි දැක්වේ.

| පළාත | 'ගැමි සැරිය' බස් සේවා සංඛ්‍යාව |
|---|---|
| මධ්‍යම | 01 |
| නැගෙනහිර | 11 |
| වයඹ | 04 |
| **එකතුව** | **16** |

**මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස**

2020 වර්ෂයේ කොවිඩ් වසංගත මධ්‍යයේ වුවද දැනට සහනාධාර ගෙවීම් යටතේ ක්‍රියාත්මක ගැමි සැරිය බස්රථ සේවාවල ධාවනය හොඳින් සිදු වූ අතර ඒ වෙනුවෙන් වැය කරන ලද මුළු වියදම රු.මි. 4.15 වේ.

### 1.3 රාත්‍රී බස්සේවා ව්‍යාපෘතිය - "නිසි සැරිය"




රාත්‍රී කාලයේ හා අළුයම කාලයේ පොදු ප්‍රවාහන බස්රථ සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම දිරිමත් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2005 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. මෙමගින් රාත්‍රී කාලයේ හා අළුයම පොදු ප්‍රවාහන බස්රථ අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම නිසා මහජනතාව පත්වන දුෂ්කරතා අවම කර ඔවුන්ට ස්ථිර පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් සැපයීමත්, මහජනයාට වෙනත් ප්‍රවාහන මාධ්‍ය සපයා ගැනීම සඳහා වැය කිරීමට සිදුවන අධික පිරිවැය අවම කිරීමත්, ඒ සඳහා වැයවන කාලය අවම කිරීමත් මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ රාත්‍රී අවසන් ගමන් වාරයට සහ අළුයම පළමු ගමන්වාරයට සහනාධාර වශයෙන් රු.19.00ක් රජය විසින් ගෙවීම් කරන අතර මහජනතාවගෙන් අයකරනු ලබන්නේ නියමිත බස්ගාස්තුව පමණි. 2019 දෙසැම්බර් 31 දින වන විට නිසි සැරිය සේවා 179 ක්‍රියාත්මක වූ අතර 2020 වර්ෂයේ නව සේවා 80 ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි.මේ සඳහා 2020 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල රු.මිලියන 24.87ක් වේ.

2020.12..31 වන විට සහනාධාර ලබමින් ක්‍රියාත්මක වන නිසි සැරිය සේවා පහත වගුවෙහි දැක්වේ.

| පළාත | 'නිසි සැරිය' බස් සේවා සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 62 |
| දකුණ | 33 |
| වයඹ | 21 |
| උතුරුමැද | 11 |
| මධ්‍යම | 37 |
| සබරගමුව | 08 |
| ඌව | 12 |
| නැගෙනහිර | 03 |
| උතුර | 05 |
| **එකතුව** | **192** |

**මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස**

ඒ අනුව 2020 වර්ෂයේ නව සේවා 13ක් සඳහා ගිවිසුම් ගත වූ අතර කොවිඩ් වසංගත හමුවේ මෙම ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ඉලක්කය වෙත ළඟාවීමට නොහැකි වූ අතර ඒ සඳහා වැය වූ මුළු වියදම රු.මි. 12.28ක් විය.

## 2. බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම

ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් මගී ජනතාවට ලබාදීමේ අරමුණින් අන්තර් පළාත් පුද්ගලික බස්රථ වල සේවය කරන සේවක මණ්ඩල විවිධ ක්ෂේත්‍ර යටතේ වෘත්තීමය පුහුණුවීම් ලබාදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමුකරමින් මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලබයි. එහිදී මාර්ග නීති පිළිපැදීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මගී සේවා අවසරපත්‍ර වෙනුවෙන් පනවා ඇති කොන්දේසි හා නියමයන් පාරිභෝගික සත්කාර සේවා සැපයීමේ ක්‍රමෝපායන්, අන්තරායකර ඖෂධ භාවිතයේ ප්‍රතිවිපාක බස්රථ තුළ කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම වැනි මාතෘකා ඔස්සේ දේශන ලබාදීමට කටයුතු කරනු ලබයි. මෙම දේශන පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය, කාන්තා හා ළමා කාර්යාංශය, ජාතික අන්තරායකර ඖෂධ නියාමන අධිකාරිය වැනි ආයතන වල ප්‍රවීන දේශකවරු සහභාගී වනු ලබයි.

අන්තර් පළාත් බස්රථවල සේවය කරන රියදුරන් පුහුණු කිරීම ආයතනය තුළදී මෙන්ම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු අභ්‍යාස විද්‍යාලයේදී ද සිදුකරනු ලබයි. එහිදී ඔවුන්ට ප්‍රායෝගික පුහුණුවීම් ලබාදීම මූලිකව සිදුකරනු ලබයි.

කාණ්ඩ කිහිපයක් ඔස්සේ මෙම පුහුණුවීම් සිදුකරනු ලබන අතර, නව රියදුරු, කොන්දොස්තරවරුන් සඳහා වෙනම පුහුණුවක්ද, දැනටමත් සේවයේ යෙදී සිටින සේවක මණ්ඩල සඳහා අවුරුදු තුනෙන් තුනට ලබාදෙන පුහුණු වැඩසටහන්ද මෙයට අයත්ය. මීට අමතරව ජාතික ගමනාගමන කොමිෂන් සභාවට වාර්තාවන විනය විරෝධී ක්‍රියාවල නිරත වූ රියදුරු කොන්දොස්තර මහතුන් වෙනුවෙන් වෙනම පුහුණු සැසි පවත්වනු ලබයි.



මේ ආකාරයෙන් ක්‍රමවේද තුනක් යටතේ අන්තර් පළාත් බස්රථ වල සේවය කරන සේවක මණ්ඩල පුහුණුවීම් සිදුකරනු ලබන අතර, එක් පුහුණු සැසියකට උපරිම 120 කගේ සහභාගීත්වය ලබාගනු ලබයි. එවැනි වැඩමුළු 50ක් පැවැත්වීම වාර්ෂික ඉලක්කය වේ. ඒ අනුව පුද්ගලයින් වශයෙන් ගත් කල වර්ෂයකට 6000ක ප්‍රමාණයක් සඳහා පුහුණුවීම් ලබාදෙනු ලැබේ.

2020 වර්ෂයේදී මෙම පුහුණු වැඩසටහන් 50ක ඉලක්කයක් සම්පූර්ණ කිරීමට ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා පැවැත්වීමට හැකියාව ලැබුණේ වැඩසටහන් 13ක් පමණි. එම වැඩසටහන් වලින් පුද්ගලයින් 1560ක ප්‍රමාණයක් සඳහා මෙම පුහුණුවීම් ලබාදෙන ලදී.

මෙම පුහුණුවීම් අවසානයේ රියදුරු කොන්දොස්තර මහතුන්ට අන්තර් පළාත් පෞද්ගලික බස්රථ වල සේවය කිරීම සඳහා හැඳුනුම්පතක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ලබාදෙන අතර, අන්තර් පළාත් බස්රථවල සේවය කිරීමට එම හැඳුනුම්පත පැළැඳ සිටීම අනිවාර්යය වේ.

Covid-19 වසංගත තත්ත්වය තුළ 2020 වර්ෂයේදී මේ ආකාරයට ලියාපදිංචිය ලබා ඇති රියදුරු කොන්දොස්තර වරුන් සඳහා රජයේ සහනාධාර ලබාදීමේ වැඩපිළිවෙලක් සමාජ ආරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද අතර, එම සහනාධාර ලබාදීම සඳහා අන්තර් පළාත් රියදුරු-කොන්දොස්තරවරුන්ගේ නම් නිර්දේශ කිරීම මෙම ලියාපදිංචිය මත පදනම්ව සිදුකරන ලදී.

2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 4.0ක් වෙන් කළ අතර 2020.12.31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.2.085ක් වැය වී ඇත. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.2.0ක් ලෙස සංශෝධනය කරන ලදි.





## 3. ප්‍රවාහන ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ

මහජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස, පිළිගත හැකි තත්ත්වයකින් යුත් බස්රථසේවා පවතින්නේද යන වග අවලෝකනය කිරීම සහ එම සේවා පවත්වාගෙන යා යුතු අවම මට්ටම තීරණය කිරීම; 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් දක්වා ඇති ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කර්තව්‍යයකි. ඒ අනුව මහජනතාවගේ අවශ්‍යතාවය පරිදි විශ්වසනීය,


ගුණාත්මක,ආරක්ෂාකාරී පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් ගෙවිය හැකි මිලකට සැපයීම සඳහා සැලසුම් සකස්කිරීමට අවශ්‍ය දත්ත රැස්කිරීම සහ එම දත්ත විශ්ලේශනය කර තීරණ ගැනීම සඳහා අදාළ පාර්ශවයන් වෙත යොමු කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා හඳුනාගැනීම සහ ඒ අනුව නව බස්රථ සේවා ආරම්භ කිරීම සඳහා ගෙන් ගෙට ගොස් සිදුකෙරෙන සමීක්ෂණ (House Hold Survey ) පවතින බස්රථ සේවා වල ධාවන කාලසටහන් සකස් කිරීම හා සංශෝධනය කිරීම සඳහා සිදුකෙරෙන මගී ඉල්ලුම් සමීක්ෂණ (Passenger Demand Survey), පවතින බස්රථ සේවාවේ ගුණාත්මක භාවය සම්බන්ධයෙන් මහජනතාවගේ තෘප්තිමත්භාවය තහවුරු කර ගැනීම සහ ඒ අනුව මහජනතාවට බලාපොරොත්තුවන ගුණාත්මක බස්රථ සේවා සැපයීම සඳහා සිදු කෙරෙන මගීන්ගේ අදහස් විමසීමේ සමීක්ෂණ (Passenger Interview Survey), බස්රථ වල ධාවන කාල නිර්ණය කිරීම සඳහා සිදුකෙරෙන ධාවන කාල සමීක්ෂණ (Travel Time Survey ) වැදගත් වේ.

2020 වර්ෂයේ සමීක්ෂණ 30ක් සිදු කිරීමට සැලසුම් කළ අතර මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙන් කරන ලද මුදල රු.මි.5.045කි. 2020 වර්ෂයේ සිදු කරන ලද සමීක්ෂණ සංඛ්‍යාව 09ක් වන අතර ඒ සඳහා වැය කරන ලද වියදම රු.මි.1.22 කි. 2020 වර්ෂයේ ආරම්භ වූ කොවිඩ් -19 වසංගතය හමුවේ සමීක්ෂණ සිදු කිරීමෙන් ලබාගන්නා දත්ත මගින් සත්‍ය තත්ත්වය විද්‍යාමාන නොවන හෙයින් සැලසුම් කළ සමීක්ෂණ සංඛ්‍යාව සිදු කිරීම තාවකාලිකව අත්හිටුවන ලද අතර වසංගත තත්ත්වය හමුවේ පොදු ප්‍රවාහන බස්රථ වල අවශ්‍යතාව හඳුනාගැනීම සහ සෞඛ්‍යාරක්ෂිතව මගීන් ප්‍රවාහනය කිරීම සඳහා ගත යුතු තීරණ ගැනීම සඳහා අවශ්‍ය වූ දත්ත රැස්කිරීම සඳහා'මගීන්ගේ අදහස් ලබාගැනීමේ' සමීක්ෂණ පමණක් සිදු කරණ ලදී. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේ මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.1.8 දක්වා අඩු කරන ලදි.

## 4. දුරගමන් සේවා සංඥා පුවරු

අන්තර් පළාත් දුරගමන් සේවා බස්රථ සෑම බස් නැවතුමකම නවත්වමින් කෙටිදුර ගමන් ගන්නා මගීන් ද රැගෙන ධාවනය කිරීම නිසා පළාත්බද ධාවනය වන කෙටි දුර ධාවන බස්රථ සේවා සමග ඇතිකරගන්නා අහිතකර තරඟය වැළැක්වීම සඳහා, දුර ගමන් සේවා බස්රථ නැවැත්වීමට සීමිත නැවතුම් ස්ථාන හඳුන්වා දීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ බස්රථ හිමියන් සමග සාකච්ඡා කර කොළඹට පිවිසෙන ප්‍රධාන පිවිසුම් මාර්ග 05හි හඳුනාගන්නා ලද සීමිත නැවතුම් සංඥා පුවරු සවිකරන ස්ථාන, මාර්ග සංවර්ධන අධිකාරියේ, කොළඹ මහ නගර සභාවේ, ශ්‍රී ලංකා පොලීසියේ අදාළ පළාත් ප්‍රවාහන අධිකාරියේ නිළධාරීන් සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් ස්ථානීය පරීක්ෂා කර සීමිත නැවතුම් සංඥාපුවරුව සවිකළ යුතු ස්ථාන භූගෝලීය වශයෙන් නිශ්චිතව හඳුනා ගැනීම මෙම වසරේ සිදු කරන ලදී.මීට අමතර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ විගණන හා කළමණාකරන කමිටුවේ උපදෙස් පරිදි මෙම සංඥා පුවරු සවිකිරීම මාර්ග



සංවර්ධන අධිකාරිය මගින් සිදු කරවා ගැනීම සඳහා එම අධිකාරිය සමග සාකච්ඡා පැවැත්වීම මෙම වසරේ සිදු කළ අතර ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් සීමිත නැවතුම් සංඥා පුවරු සකස් කර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබාදුන් පසු එම සංඥා පුවරු හඳුනාගත් ස්ථාන වල සවිකිරීම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කිරීමට සාකච්ඡා විය. 2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 5.13ක් වෙන් කළ අතර 2020.12.31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.0.75ක් වැය වී ඇත. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.2.5 දක්වා අඩු කරන ලදි.

## 5. කාලසටහන් පිළියෙල කිරීම හා සංශෝධනය කිරීම

2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතින් සංශෝධිත 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන පනතේ පූර්විකාවේ (අ) ඡේදය අනුව "විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහනක් මත ඇත්ත වශයෙන් වූ මගී ඉල්ලීම් සපුරාලීම සඳහා ප්‍රවීන රාජ්‍ය බස් සේවයක් හෝ පෞද්ගලික බස් සේවයක් ලබාගැනීම" ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සහ පෞද්ගලික බස්රථ සඳහා පොදු කාලසටහන් සකස් කරනු ලැබේ. මෙමගින් පෞද්ගලික බස්රථ හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ අතර හා/හෝ පෞද්ගලික, පෞද්ගලික බස්රථ අතර හා /හෝ ශ්‍රී ලංගම හා ශ්‍රී ලංගම බස්රථ අතර ධාවනයේ දී ඇති වන අහිතකර තරඟය අවම කර එක් එක් පාර්ශවය වෙත නිශ්චිත වූ වෙළඳපොළ කොටස වෙන් කර දීම තුලින් හිතකර තරඟකාරීවයක් ඇතිකර මහජනතාවට විශ්වසනීය, ආරක්ෂිත බස්රථ සේවාවක් සැපයීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

අතිගරු ජනාධිපති තුමාගේ රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුවද "ගමනාගමන මණ්ඩලය සහ පෞද්ගලික බස්රථ ඒකාබද්ධව තරඟකාරීත්වයකින් තොරව සාධාරණව ආදායම් උපයා ගත හැකිවන ලෙස පොදු කාලසටහනක් යටතේ සෑම මාර්ගයකටම දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවාවක් ලබාදීමට කටයුතු කරනු ඇත". ලෙස සඳහන් වන අතර ඒ අනුව 2020 වර්ෂයේ ඒකාබද්ධ කාලසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම කඩිනම් කිරීම සඳහා ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව ඇතුළු ආයතන වල නිළධාරීන්ගේ සහ ප්‍රවාහන සේවා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමියගේ සභාපතිත්වයෙන් සහ ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වරයෙකුගේ ලේකම් වශයෙන් කටයුතු කරන කමිටුවක් පිහිටුවන ලදී. ඒ අනුව ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම සඳහා මාර්ග හඳුනාගැනීම මෙම කමිටුව විසින් සිදු කළ අතර පළමුව කොළඹට පිවිසෙන ප්‍රධාන පිවිසුම් මාර්ග වල ඒකාබද්ධ කාලසටහන් සකස් කර අවසන් කිරීමට එම කමිටුව මගින් තීරණය කරන ලදී. ඒ අනුව පළමු අදියර වශයෙන් මහනුවර පිවිසුම තෝරාගත් අතර ඒ අනුව මහනුවර -කොළඹ සාමාන්‍ය සේවාවේ සහ මහනුවර -පානදුර සේවාවේ ඒකාබද්ධ කාලසටහන් සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

2020 වර්ෂයේ ඒකාබද්ධ කාලසටහන් 30ක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ අතර මේ සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් රු.මි.2.00ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලදී. නමුත් කොවිඩ්-19 වසංගත තත්ත්වය රටතුළ ව්‍යාප්ත වීමත් සමග පොදු ප්‍රවාහන බස්රථ ධාවනය අක්‍රමවත් වීම, බස්රථ සම්පූර්ණයෙන්ම ධාවනයෙන් ඉවත් කිරීම හා 2020 වර්ෂය අවසන් වන තෙක් පොදු ප්‍රවාහන බස්රථ සේවය සාමාන්‍ය තත්ත්වයට පත් නොවූ බැවින් මෙම ව්‍යාපෘතිය සැලසුම් කළ ඉලක්ක කරා ළඟාවීමට නොහැකි විය. නමුත් කොවිඩ් -19 වසංගතය හේතුකොටගෙන ඇතිවූ මගී ඉල්ලුමේ වෙනස්වීම අනුව එතෙක් ක්‍රියාත්මක වූ කාලසටහන් නව මගී ඉල්ලුම අනුව සංශෝධනය කර ක්‍රියාත්මක කරන ලද අතර ඒ අනුව සංශෝධනය කර ක්‍රියාත්මක කරන ලද කාලසටහන් සංඛ්‍යාව 13 කි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේ වැය වූ මුදල රු.මි.0.34ක් වේ. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි. 0.5 දක්වා අඩු කරන ලදි.

## 6. බස් ගාස්තු විෂමතා ඉවත් කිරීම

2002 වර්ෂයේ සිට ක්‍රියාත්මක ජාතික බස්ගාස්තු ප්‍රතිපත්තිය අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් වාර්ෂික බස් ගාස්තු සංශෝධනය කිරීම සිදු කරනු ලැබේ.මෙම ගාස්තු ප්‍රතිපත්තිය අනුව සෑම වසරකම ජූලි මස 01 දින බස්ගාස්තු සංශෝධනය කළ යුතු අතර ඊට අමතරව ඉන්ධන මිල සමස්ත කි.මී.01 ක පිරිවැය 4% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් ඉහල නැංවීමට දායකවූ අවස්ථාවක අන්තර්වාර බස්ගාස්තු සංශෝධනය සිදු කරනු ලැබේ.

ඒ අනුව 2020 වර්ෂයේ පැවති මිල ගණන් හා ගැලපීමේදී සමස්ත කි.මී. 01 ක පිරිවැය බස් ගාස්තු සංශෝධනයක් සිදු කිරීමට තරම් ප්‍රමාණවත් නොවූ හෙයින් 2020 ජූලි 01 දින වාර්ෂික බස්ගාස්තු සංශෝනයක් සිදු නොකරන ලදී. නමුත් කොවිඩ් වසංගත දෙවන රැල්ල හමුවේ සෞඛ්‍ය උපදෙස් අනුව පොදු ප්‍රවාහන බස්රථවල ආසන ගණනට පමණක් මගීන් රැගෙන යායුතු බවට රජය විසින් ගන්නා ලද තීන්දුවට අනුව කැබිනට් මණ්ඩල අනුමැතියකින් සාමාන්‍ය සේවා බස්රථ වල බස් ගාස්තුව 2020.11.11 දින සිට 20% කින් වැඩිකරන ලදී. නමුත් ආසන ගත මගීන් පමණක් රැගෙන යා හැකි බස්රථ සේවාවල ( අර්ධ සුඛෝපභොගී /සුඛෝපභොගී / අධි සුඛෝපභෝගී ) බස් ගාස්තු සංශෝධනයක් සිදු නොකරන ලදී.

ඌව පළාත තුළ ධාවනය වන ශ්‍රී ලංගම හා පෞද්ගලික බස්රථ සේවා වල බස්ගාස්තු විෂමතා ඉවත් කිරීම සිදු කිරීමට ඌව පළාත් ප්‍රවාහන අධිකාරිය හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත උපදෙස් නිකුත් කිරීම මෙම වසරේ සිදු කරන ලදී. ඒ අනුව ඔවුන් විසින් අදියර කිහිපයක් යටතේ බස්ගාස්තු විෂමතා ඉවත් කිරීමට එකඟ වන ලදී.

දැනට ක්‍රියාත්මක බස්ගාස්තු ප්‍රතිපත්තිය වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම සඳහා මාර්ග 100 සමීක්ෂණ කටයුතු 2020 මාර්තු මස වන විට මාර්ග 09ක සිදු කළ අතර ඉන්පසු ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හේතුකොටගෙන මගීන් බස්රථවල ගමන් කිරීමේ සාමාන්‍ය තත්ත්වයට පත් නොවූ හෙයින් 2020 වර්ෂය තුළ මෙම සමීක්ෂණ සිදු කිරීමට නොහැකි විය. 2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 3.00ක් වෙන් කළ අතර 2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා වැය වූ මුදල රු.මි.1.75 ක් වේ. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.1.6 දක්වා අඩු කරන ලදී.

## 7. ප්‍රවාහනය සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්

මාර්ග ආරක්ෂාව සම්බන්ධව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම ප්‍රවාහන සැලසුම්කරණය, කාලසටහන් සකස්කිරීම, කාර්යාලීය ක්‍රම සම්බන්ධව පළාත් ප්‍රවාහන අධිකාරීවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්, බස්රථ ධාවනය, සේවක මණ්ඩල කළමනාකාරීත්වය, මගීසේවා අවසරපත්‍ර කොන්දේසි සම්බන්ධව බස්රථ ධාවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මගී අයිතිවාසිකම් සම්බන්ධව මගීන් දැනුවත් කිරීම මෙන්ම බස්රථ රියදුරු කොන්දොස්තර මහතුන් දැනුවත් කිරීමේ වැඩසටහන්ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය දීප ව්‍යාප්තව පළාත් කේන්ද්‍රකොට තෝරාගත් ස්ථාන වල පවත්වන අතර, ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

2020 වර්ෂයේදී මෙවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් 15ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර තිබුණද Covid-19 වසංගත තත්ත්වය හමුවේ පැවැත්වීමට හැකියාව ලැබුණේ වැඩසටහන් 02ක් පමණි.

එහිදී ශ්‍රී ලංකා පොලීසිය සමග එක්ව බස්නාහිර පළාත තුළ අන්තර් පළාත් හා පළාත් තුළ ධාවනය කරන බස්රථ ධාවනය කිරීමට ලියාපදිංචි වී ඇති රියදුරු මහතුන් 2000ක් සඳහා රිය අනතුරු වළක්වා ගැනීමේ ක්‍රමෝපායන් සම්බන්ධව දැනුවත් කිරීම් සිදුකරන ලදී. කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්ක පදනම් කරගෙන මෙම වැඩසටහන් පවත්වන ලදී.

2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 5.50ක් වෙන් කළ අතර 2020.12.31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.0.37ක් වැය වී ඇත. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.0.5 දක්වා අඩු කරන ලදී.






## 8. තොරතුරු තාක්ෂණ පද්ධතිය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණික ඒකකය විසින් ආයතනයේ දෘඩාංග හා මෘදුකාංග පද්ධති සංවර්ධනය කිරීම, ස්ථාපනය කිරීම මෙන්ම ආයතනයේ කාර්යය පහසු කරගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික මැදිහත්වීම් සිදුකිරීම මෙම අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් වේ. මෙම තොරතුරු තාක්ෂණික ඒකකය හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති ගණනාවක් පවතින අතර, එම ව්‍යාපෘති වල 2020 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

### 8.1 ආයතනික ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය

ආයතනික කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම පරිගණක මෘදුකාංගයක් හරහා සිදුකිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. මෙම ව්‍යාපෘතියේදී ආයතනයේ පවතින ධාවන, සැලසුම් හා තත්ත්ව ආරක්ෂණ යන දෙපාර්තමේන්තු වල සිදුකරනු ලබන කාර්යයන් හඳුනාගෙන එම කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම කාණ්ඩ 03ක් යටතේ සිදුකරන ලදී. ඒ තුළින් මහජනතාවට ඉක්මන් සේවාවක් ලබාදීමටත්, ආයතනයේ ලිපිගොනු කටයුතු ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදයක් හරහා සිදුකිරීමෙන් වඩා විශ්වාසදායී ආරක්ෂාකාරී මෙන්ම කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම ද මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

මෙම එක් එක් පද්ධති ක්‍රියාත්මක වීමේදී මෙම පද්ධති හරහා කාර්යයන් සිදුකරන නිලධාරීන් මෙම ව්‍යාපෘතියට අනුගත කරගැනීම හා භාවිතා කරන්නන්ට වඩාත් පහසුකම් සහිතව (User Friendly) එම පද්ධතින් හැසිරවීමට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලදී. 2020 වර්ෂයේදී මෙම මෘදුකාංගය වඩාත් සුමටව භාවිතා කිරීමට අවශ්‍ය වූ ඒ ඒ දෙපාර්තමේන්තු විසින් ඉල්ලා ඇති සංශෝධන (Changes) සිදුකිරීමට වැඩි කාලයක් ගතකරන ලදී. එසේම මගී සේවා අවසරපත්‍රය වෙනුවට NFC කාඩ්පතක් නිකුත් කිරීමටද 2020 වර්ෂයේදී කටයුතු ආරම්භ කරන ලදී.

## 8.2 ගූගල් තාක්ෂණය ඔස්සේ පොදු ප්‍රවාහන සේවා හඳුනාගැනීම (GTFS)

ගූගල් සිතියම තුළට පොදු ප්‍රවාහන සේවා ඇතුළත් කිරීම 2019 වර්ෂයේදී සිදුකළ අතර, එම ව්‍යාපෘතියේ තවත් දිගුවක් වශයෙන් සියලු පළාත් ප්‍රවාහන අධිකාරීන්ගේ බස්රථ ගමන් මාර්ග මෙම ව්‍යාපෘතියට ඇතුල් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකළ නමුත් මෙම Covid - 19 අභියෝගය හමුවේ වසංගත තත්ත්වය තුළ 2020 වර්ෂය තුළ සැලසුම් කරන ලද ඉලක්ක කරා යා නොහැකි වුවද දකුණු පළාත් ප්‍රවාහන අධිකාරියේ මාර්ග අටක් ගූගල් සිතියමට ඇතුළත් කළ අතර ප්‍රවාහන අධිකාරී සියල්ල ගෙන්වා මෙම මාර්ග තොරතුරු ගූගල් සිතියමට ඇතුළත් කරන ආකාරය සම්බන්ධව එක්දින පුහුණුවක් ලබාදෙන ලදී.


2019 වර්ෂයට අදාළව 2020 වර්ෂයේ තොරතුරු සන්නිවේදනය හා සන්නිවේදන තියෝජිත ආයතනය විසින් පවත්වන ලද ඊ ස්වාභිමානී සම්මාන උළලේදී මෙම ව්‍යාපෘතිය මහජනතාවට තොරතුරු ලබාදීම සම්බන්ධ අංශය යටතේ සම්මානයට පාත්‍රවන ලදී.





## 8.3. MyBus-SL Application එළිදැක්වීම

සියලු මගීන්ට භාවිතා කළහැකි MyBus-SL App එළිදැක්වීම 2020 වර්ෂයේ සිදුකිරීම තොරතුරු තාක්ෂණික අංශය ලබන ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

ජීපීඑස් තාක්ෂණය හරහා තමන්ට අවශ්‍ය බස්රථය තිබෙන ස්ථානය හඳුනා ගැනීම, බස්රථවල කාලසටහන හා බස් ගාස්තුව දැන ගැනීමට හැකිවීමද, ඊට අමතරව ආසන වෙන් කිරීමේ පහසුකම ලබාදීම පමණක් නොව මගීන්ගේ පැමිණිලි මෙන්ම විමසීම්ද මෙම ඇප් එක හරහා සිදුකරගැනීමට අවශ්‍ය පහසුකම ලබාදී තිබීම වැනි සුවිශේෂතා මෙම App එකෙන් සිදුකිරීමේ හැකියාව ඇත.



### 8.4. බස්රථ සඳහා GPS සවිකිරීම



2020 වර්ෂය වන විට GPS ඒකකය හරහා බස්රථ 1400ක් නියාමනය වන අතර, අධි සුඛෝපභෝගී හා සුඛෝපභෝගී බස්රථ සියල්ලෙහිම GPS සවිකිරීම අවසාන කර ඇත. අර්ධ සුඛෝපභෝගී බස්රථ වලින් 60%ක් 2020 වර්ෂය වනවිට GPS සවිකර ඇති අතර, එම බස්රථ දෛනිකව පාලන මැදිරිය හරහා නියාමනය වනු ලබයි. MyBus-SL App එක හරහා GPS සවිකර ඇති බස්රථ සියල්ල සම්බන්ධ සජීවී තොරතුරු බස් මගීන්ට බලාගැනීමට හැකියාව 2020 වර්ෂයේදී ලබා දෙන ලදී.

2020 වර්ෂයේ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිය සඳහා රු.මි. 23.0ක් ද GPS උපකරණ සවිකිරීම, නඩත්තු කටයුතු හා මෙහෙයුම් මැදිරිය පවත්වාගෙන යාම සඳහා රු.මි. 8.13ක් ද වෙන් කළ අතර 2020.12.31 දිනට මෙම ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.මි.1.34ක් හා රු.මි. 6.64ක් වැය වී ඇත. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල් පිළිවෙලින් රු.මි.5.0 හා රු.මි.6.9 දක්වා අඩු කරන ලදි.

## 9. පෙරගෙවුම් කාඩ් ක්‍රමය (Electronic Fare Collection)

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වාදෙනු ලබන ජාතික කාඩ්පත් යෝජනාවලිය (JCB කාඩ්පත) යටතේ ප්‍රවාහනයේදී භාවිතා කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන මාර්ගස්ථ පෙරගෙවුම් කාඩ්පතක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය Backend මෘදුකාංගය ලබාගැනීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ අදාල මෘදුකාංගය සකස් කිරීම සඳහා සුදුසු ආයතනයක් තෝරාගැනීම සිදුකරන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 25.00ක් වෙන් කළ අතර 2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා වැය වූ මුදල රු.මි.0.15 ක් වේ. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.2.00 දක්වා අඩු කරන ලදි.

## 10. මහජන පැමිණිලි

ගුණාත්මක මගී ප්‍රවාහනයක් මගී ජනතාවට ලබාදීම සඳහා පොදු ප්‍රවාහන සේවාවේ හැසිරීම ඉතා සියුම්ව නිරීක්ෂණය කළ හැකි මාධ්‍යය වන්නේ, මෙම සේවාවන් වෙත ලැබෙන මහජන ප්‍රතිචාරයි.

ඒ අනුව බස්රථවල ගමන්කරන මගීන් ඔවුන් ලබාගන්නා සේවාව සම්බන්ධව එම බස්රථවල සේවක කණ්ඩායම්හි හැසිරීම සම්බන්ධව යම් ගැටලුකාරී තත්ත්වයන් ඇති වුවහොත් ඒ සම්බන්ධව පැමිණිලි කිරීමට වෙනම මහජන පැමිණිලි ඒකකයක් ආයතනය තුළ ස්ථාපිත කර ඇත. එහිදී පැය 24ම දින 07 පුරාම ක්‍රියාත්මක වන ක්ෂණික ඇමතුම් ඒකකය හරහා බස්රථ සේවා සඳහා වන පැමිණිලි ලබාගන්නා අතර, එම පැමිණිලි එම අවස්ථාවේදීම පැමිණිලි විමර්ශන ඒකකය වෙත යොමුකරනු ලබයි. පැමිණිල්ල ස්වයංකරණ පද්ධතියට එක්කළ වහාම

පැමිණිලිකරුගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක් හරහා පැමිණිල්ලට අදාල විමසීම් අංකය යවනු ලැබේ.

මෙම ලැබෙන පැමිණිලි වලින් අන්තර් පළාත් බස්රථ සම්බන්ධව ලැබෙන පැමිණිලි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේම විභාග කරන අතර, පළාත් අධිකාරී බස්රථ සම්බන්ධව ලැබෙන පැමිණිලි එම අධිකාරීන් වෙත යොමුකරනු ලබයි. එසේම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහා ලැබෙන පැමිණිලි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත යොමුකරයි.

ක්ෂණික දුරකථන ඇමතුම් ඒකකය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමට අමතරව ලිපි මගින්, ෆැක්ස් මගින්, ඊ මේල් මගින් හා MyBus-SL App හරහා මෙම පැමිණිලි ඉදිරිපත් කිරීම සිදුකරනු ලබයි. ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අන්තර් පළාත් බස්රථ සම්බන්ධව යොමුකරනු ලබන පැමිණිලි සියල්ල සියුම්ව නිරීක්ෂණය කරන අතර, මෙම පැමිණිලි වල ස්වභාවය අනුව අවවාද කිරීම, සේවක මණ්ඩල සේවා අත්හිටුවීම්, පරිපාලන ගාස්තු අයකිරීම් වැනි ක්‍රියාමාර්ග මෙන්ම අවසරපත්‍ර ගමන්වාර අත්හිටුවීම් සහ සමහර අවස්ථාවලදී මගීසේවා අවසර පත්‍ර අවලංගු කිරීම් දක්වාද කටයුතු කරනු ලබයි.

2020 වර්ෂයේදී Covid-19 තත්ත්වය හමුවේ පොදු ප්‍රවාහන සේවා නිසිපරිදි ක්‍රියාත්මක නොවූ බැවින් අනෙකුත් වර්ෂ වලට සාපේක්ෂව පැමිණිලි ලැබීමේ අඩුවීමක් දක්නට ලැබේ. 2020 වර්ෂයට අදාල පැමිණිලි ලැබීමේ සංඛ්‍යාත්මක තොරතුරු වගුව පහත පරිදි වේ.

| වර්ෂය | | 2020 | |
|---|---|---|---|
| අනු අංකය | විස්තරය | ලද පැමිණිලි සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස % |
| 01 | වැඩිපුර ගාස්තු අයකිරීම/ ඉතිරි මුදල් ලබානොදීම. | 595 | 13 |
| 02 | මගීන්ට ආචාරශීලී නොවීම | 710 | 16 |
| 03 | නියමිත ප්‍රමාණයට වඩා වැඩි මගීන් රැගෙන යාම. | 304 | 7 |
| 04 | නියමිත පරිදි ප්‍රවේශ පත්‍ර නිකුත් නොකිරීම. | 525 | 12 |
| 05 | නොසැලකිලිමත් රිය පැදවීම. | 433 | 10 |
| 06 | මාර්ග බලපත්‍ර නොමැතිව ධාවනය කිරීම. | 71 | 2 |
| 07 | අතරමග ස්ථානවල අනවශ්‍ය ආකාරයට බස්රථය නවත්වා මගීන් එකතු කිරීම. | 441 | 10 |
| 08 | නියමිත කාලසටහන උල්ලංඝනය කිරීම. | 40 | 1 |
| 09 | නියමිත ස්ථානයෙන් ගමන් ආරම්භ නොකිරීම හා ගමනාන්තය දක්වා ධාවනය නොකිරීම. | 280 | 6 |
| 10 | බස්රථය මගී ප්‍රවාහනයට සුදුසු තත්ත්වයේ නොතිබීම. | 101 | 2 |
| 11 | වායු සමීකරණ නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම. | 44 | 1 |
| 12 | අධික ශබ්දයෙන් කැසට්/ රේඩියෝ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම/ නොගැලපෙන වීඩියෝ පට ප්‍රදර්ශනය | 388 | 9 |
| 13 | මගී ප්‍රවාහන බස්රථ අතර ඇතිවන ගැටුම් | 233 | 5 |
| | එකතුව | 4464 | |

**මුලාශ්‍රය - තත්වාරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව, ජාගකොස**

2020 වර්ෂයේදී අන්තර් පළාත් පෞද්ගලික බස්රථවලදී මගී ජනතාව මුහුණ දුන් විවිධ ගැටලු පාදක කරගෙන පැමිණිලි 4464 ක් ඉදිරිපත් වී ඇති අතර, ඉන් වැඩිපුරම පැමිණිලි ලැබී ඇත්තේ මගීන්ට ආචාරශීලී නොවීම සම්බන්ධවයි. සංඛ්‍යාත්මක වශයෙන් පැමිණිලි 710කි.

පසුගිය වසර හා සැසඳීමේදී මෙය අඩු අගයක් ගත්තද Covic-19 වසංගත තත්ත්වය හමුවේ පොදු ප්‍රවාහන බස්රථ ධාවනය නොවීම නිසා මෙම අඩු අගය වාර්තා වී ඇති බව පැහැදිලි වේ.

මෙම පැමිණිලි සියල්ල විමර්ශනයට ලක්කර බස් හිමිකරුවන්ට, සේවක මණ්ඩලයට අවවාද කිරීම්, පරිපාලන ගාස්තු අයකිරීම්, පුහුණුවට යොමුකිරීම් හා මගී සේවා අවසර පත්‍ර අත්හිටුවීම් වැනි ක්‍රියාමාර්ග ගනු ලබයි.


## 11. ආයතනික ප්‍රතිසංස්කරණ හා යටිතල පහසුකම් සංවර්ධනය

ප්‍රාග්ධන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියට පහත සඳහන් ව්‍යාපෘති/කාර්යයන් ඇතුළත් වේ. එනම්,

### 11.1 බස් නැවතුම්පළ ඉදිකිරීම හා නවීකරණය

2020 වර්ෂයේදී බස් නැවතුම්පල ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු සිදු නොකළ අතර බස්රථ සේවකයින්ගේ කායික මානසික විඩාව සංසිඳුවා ගැනීම සඳහා නවීකරණය කරන ලද කන්ටේනර් භාවිතා කර බැස්ටියන් මාවත පරිශ්‍රයේ විවේක ස්ථාන ස්ථාපිත කිරීම සිදු කරන ලදී. මෙම විවේක ස්ථාන 2020 වර්ෂයේ මුල් කාර්තුව තුළ බස්රථ සේවකයන් හට පරිහරණය සඳහා අවස්ථාව ලබාදුන් නමුදු උද්ගතවූ කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් යළි දන්වන තුරු භාවිතය අත්හිටුවන ලදී







### 11.2 ජා.ග.කො.ස. ගොඩනැගිලි අලුත්වැඩියාව

2020 වර්ෂය තුළ සැලසුම් කරනලද ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ කටයුතු ආරම්භ කිරීමත් සමග කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය සිදුවීම නිසා එම කටයුතු තාවකාලිකව අත්හිටවූ අතර 2020 වර්ෂය අවසන් වන විටද ආරම්භ කළ නොහැකි වූ බැවින් ඉදිරි වර්ෂය තුළ අවසන් කිරීමට අපේක්ෂිතය.

### 11.3 විදුලි බලය පිරිමැසීම සඳහා ආයතනය තුළ විකල්ප බලශක්ති උත්පාදනය (සූර්ය කෝෂ)

මෙම ව්‍යාපෘතියෙහිදී සූර්ය කෝෂ සවිකිරීම සඳහා නියමිත පරිදි වහලය සකස් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. මෙම ව්‍යාපෘතියද කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් 2021 වර්ෂය දක්වා කල් දමා ඇත.

ව්‍යාපෘතිය සඳහා රු.මි. 26.85ක් වෙන්කරන ලද අතර 2020.12.31 දිනට වැය වී ඇත්තේ රු.මි. 0.89 ක මුදලක් පමණි. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.4.5 ක් දක්වා අඩු කරන ලදි.


- බැස්ටියන් මාවත හා වව්නියාව බස් පර්යන්ත අලුත්වැඩියා කටයුතු
- බැස්ටියන් මාවත බස් නැවතුම්පොළෙහි ආබාධිත පුරවැසියන් සඳහා පහසුකම් සැලසීම

මෙම ව්‍යාපෘති දෙක සම්බන්ධයෙන්ද සැලසුම් කළ කටයුතු කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් 2021 වර්ෂය තෙක් කල් දමන ලදී.

මීට අමතරව පුනරාවර්තන ව්‍යාපෘති යටතේ බැස්ටියන් මාවත හා වව්නියාව බස්පර්යන්ත වල සිදුකරනු ලබන බස්රථ ධාවන කටයුතු අධීක්ෂණය කිරීමත් හටගත් කොවිඩ් 19 වසංගතය මැඩලීම සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් මගී ප්‍රවාහන කටයුතු මෙහෙයවීමත් බස් පර්යන්ත පවත්වාගෙන යාමත් ඉතා ඉහල මට්ටමින් සිදු කරන ලදී.

## 12. අන්තර් පළාත් මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම

| අනු අංකය | සේවා වර්ගය | බස්රථ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සාමාන්‍ය | 1,937 |
| 2 | අර්ධ සුඛෝපභෝගී | 601 |
| 3 | සුඛෝපභෝගී | 426 |
| 4 | අධි සුඛෝපභෝගී | 105 |
| එකතුව | | 3,069 |





මූලාශ්‍රය - ධාවන හා සේවා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ජාගකොස

## 13. ජංගම පරීක්ෂණ හා විමර්ශනය


1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව අන්තර් පළාත් මගී ප්‍රවාහන පෞද්ගලික බස්රථ සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ. එම අවසරපත්‍ර යටතේ ධාවනය කරනු ලබන බස්රථ වෙනුවෙන් කොන්දේසි මාලාවක් පනවා ඇති අතර එම කොන්දේසි වලට අනුකූලව බස්රථ ධාවනය කරන්නේද යන්න පරීක්ෂා කිරීම, ජංගම පරීක්ෂණ ඒකකය විසින් ඉටු කරනු ලබයි.


ජංගම පරීක්ෂණ අංශය මගින් මාර්ගස්ථව පරීක්ෂා කරනු ලබන බස්රථ වලින් හඳුනාගන්නා කොන්දේසි කඩකිරීම් සඳහා පරිපාලන ගාස්තු අයකිරීම, පුහුණුවීම් සඳහා යොමුකිරීම, මගී සේවා අවසර පත්‍ර අත්හිටුවීම මෙන්ම අවලංගු කිරීම් සිදුකිරීමද මේ ඒකකය යටතේ සිදුකරනු ලබයි. 2020 වර්ෂයේ පැවැති Covid-19 වසංගත තත්ත්වය හමුවේ ජංගම පරීක්ෂණ සඳහා නිලධාරීන් යෙදවීම සීමා වූ අතර, ඒ අනුව 2020 වර්ෂයේ විමර්ශනය කරන ලද කොන්දේසි කඩකිරීම් ගණන 1084කි.

## 14. ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව










ශ්‍රී ලංකා මහ බැංකුව,මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ලංකා වරාය අධිකාරිය, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, ඇතුළු ප්‍රවාහනය සම්බන්ධිත ආයතනයක් වන CILT ආයතනය ආදී ආයතන රාශියකින් තොරතුරු හා දත්ත ඒකරාශී කර එම දත්ත විශ්ලේෂණය කර ඉතා ආකර්ෂණීය ලෙස සකස් කරනු ලබන 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව' අඛණ්ඩව වර්ෂයක් පාසා මුද්‍රිත ග්‍රන්ථයක් වශයෙන් භාෂා ත්‍රිත්වයෙන්ම එළිදක්වනු ලැබේ.

ගොඩබිම, ජලය හා ගුවන් යන මාධ්‍ය තුන හරහා සිදුකරන සියළු ප්‍රවාහන කාර්යයන් පිළිබඳ තොරතුරු එකම ස්ථානයකින් ලබාගතහැකි මාධ්‍යයක් ලෙස 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව' මේ වන විට ප්‍රවාහන ක්ෂේත්‍රයේ සියළු විද්වතුන්ගේ පැසසුම් ලබන මාහැඟි ග්‍රන්ථයක් වී තිබේ. ප්‍රවාහනය පිළිබඳ පර්යේෂණ කරන, සැලසුම් සකස් කරන ආයතන හා විද්වතුන්ට මෙන්ම ප්‍රවාහනය පිළිබඳ අධ්‍යයන කටයුතු වල යෙදෙන අයටද මෙම වාර්තාව පරිශීලනය කිරීම එම කටයුතු සඳහා මහත් පිටිවහලක් වී ඇත. 2020 වර්ෂය අවසන් වන විට ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛණ 2018 වාර්තාව බෙදාහැරීමේ කටයුතු අවසන් කරනු ලැබූ අතර 2019 වර්තාව එළි දැක්වීමේ කටයුතු 90% ක් පමණ අවසන් කරමින් පැවතිනි. මෙම වාර්තාව දිවයින පුරා පිහිටි ප්‍රවාහනයට සම්බන්ධ විවිධ ආයතන, මහජන පුස්තකාල, ප්‍රධාන පාසල් හා විශ්ව විද්‍යාල වලටත් බෙදා හැරීම සිදු කරන අතර උසස් අධ්‍යාපන කටයුතු සඳහා ඉල්ලුම් කරන ඕනෑම අයෙකුටද ලබා දෙනු ලැබේ.

2020 වර්ෂයේ මේ සඳහා රු. මි. 2.5ක් වෙන් කළ අතර 2020.12.31 වන විට ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 0.11ක මුදලක් වැය කරන ලදී. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.1.5 දක්වා අඩු කරන ලදි.

## 15. සේවක පුහුණුව හා සංවර්ධනය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක මණ්ඩලය විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා වලට යොමු කිරීම තුළින් ආයතනයට අවශ්‍ය වන්නාවූ දැනුම හා කුසලතා වලින් පිරිපුන් සේවක මණ්ඩලයක් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ.

2020 වර්ෂයේ ද සේවක මණ්ඩලය වෙත දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා සැලසුම් කර රු.මි. 2.4ක් වෙන්කර තිබූ නමුත් පළමු කාර්තුව අවසන් වීමටත් ප්‍රථම කොවිඩ් 19 වසංගතය පැතිරීම සිදු වූ බැවින් කාර්යාල වසා දැමීමත් ආරක්ෂක හා සෞඛ්‍ය හේතූන් මත අදාල පුහුණු පාඨමාලා පැවැත්වීමත් රජය විසින්ම අත්හිටවූ බැවින් පුහුණු වැඩසටහන් වෙත නිලධාරීන් යොමු කිරීම සිදු නොකරන ලදී. 2020 වර්ෂයේ කරන ලද අයවැය සංශෝධනයේදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද රු.මි.2.4 ක මුදල වෙනත් ව්‍යාපෘතියක් සඳහා යොමු කරන ලදි.

## 16. කොවිඩ් 19 වසංගත කාලය තුළ සිදු කරන ලද කාර්යයන්

2020 වර්ෂයේ මාර්තු මස ඇතිවූ කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් නොකළ කාර්යයන් රැසක් ඉටු කිරීමට සිදු විය. තවද, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මඟීසේවා අවසරපත්‍ර නිකුත් කර ඇති අන්තර් පළාත් බස්රථ, ධාවනය මුළුමනින්ම අත්හිටුවීමට සිදුවීම එම බස්රථ ධාවකයින්ගේ ආදායම අහිමිවීමට හේතු වූ බැවින් ඔවුන්ට සහන සැලසීම සඳහා ඔවුන් විසින් ගෙවිය යුතු ටෙන්ඩර් ගාස්තු හා අවසරපත්‍ර යාවත්කාලීන කිරීමේ ගාස්තු, ලොග් පත්‍ර, පිවිසුම් පත්‍ර ගාස්තු සම්පූර්ණයෙන්ම අය නොකිරීම සිදු කරන ලදී. තවද 2020.03.16 දින සිට රජය නිවාඩු දින ප්‍රකාශ කිරීමත් සමග කොළඹ හා තදාසන්න නගර වල සිට ගම්බිම් කරා ගිය මගීන් සඳහා අධිවේගී මාර්ගයේ සහ අනෙකුත් බස්රථ නැවතුම් ස්ථාන වලින් කඩිනම් ප්‍රවාහන සේවා සැපයීම සඳහා කටයුතුකිරීම උපදෙස් ලද විගසම බැස්ටියන් මාවත අන්තර් පළාත් බස් පර්යන්තය හා ප්‍රධාන කාර්යාල පරිශ්‍රය විෂබීජ හරණය කිරීම සහ අත්සේදීම සඳහා පහසුකම් සැලසීම.රු 5000/-දීමනාව බස්රථ සේවක කණ්ඩායම් සඳහා ලබාගැනීමට සැලැස්වීම සඳහා අදාල බස්රථ සේවක කණ්ඩායම් වල ලැයිස්තු සකස්කර සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම.ඇඳිරි නීතිය පනවා තිබූ මුළු කාලය තුළ මහජනතාව විසින් පොදු ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් කරනු ලබන විමසීම් සඳහා 1955 ක්ෂණික දුරකථන ඇමතුම පැය 24 පුරා ක්‍රියාත්මකව පවත්වාගෙන යාම. අවදානම අඩු දිස්ත්‍රික්කවල ඇඳිරිනීතිය කිසියම් නිශ්චිත කාලසීමාවක් සඳහා ලිහිල් කිරීමට රජය ගත් තීරණයත් සමග සෞඛ්‍ය උපදෙස් අනුව සමාජ දුරස්ථභාවය පවත්වා ගනිමින් (Zig –Zag ක්‍රමයට) පොදු ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් උපදෙස් සකස් කිරීම සහ එම උපදෙස් සියලුම පළාත් ප්‍රවාහන අධිකාරී වලට සහ ශ්‍රී ලංගම වෙත ලිඛිතව යොමු කිරීම.සාමාජ දුරස්ථ භාවය පවත්වා ගනිමින් බස්රථ වල ආසනගත මගීන් පමණක් රැගෙන යාම නිසා පෞද්ගලික බස්රථ ධාවකයින්ට සේවාව පවත්වාගෙන යා නොහැකි බව බස්රථ සංගම් විසින් කරන ලද ඉල්ලීම් අනුව සෞඛ්‍ය උපදෙස් පරිදි සාමාන්‍ය සේවා බස් රථ වල ආසන ගණනට පමණක් මගීන් රැගෙන යාම නිසා පෞද්ගලික බස්රථ හිමියාට වන හානිය අවම කිරීම සඳහා කැබිනට් අනුමැතිය අනුව සාමාන්‍ය සේවා බස් ගාස්තුව 20%කින් ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන බස්රථ වල මගීන් ගමන් කිරීමේදී අනුගමනය කළයුතු සෞඛ්‍ය උපදෙස් අඩංගු කර CD, DVD, පට මුද්‍රණය කර බස්රථ වලට ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම, බස්රථ තුළ හා බස්රථයේ පිටත සෞඛ්‍ය උපදෙස් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කිරීම සිදු කරන ලදී.

# වාර්ෂික ගිණුම්

| දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | සටහන් | 2020 | 2019 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහඋපකරණ | 4 | 405,037,914.34 | 431,237,126.24 |
| නොනිමි වැඩ | | 30,502,154.10 | 30,674,726.89 |
| පුස්තකාල පොත් | | 1,269,973.81 | 1,269,973.81 |
| **මුලු ජංගම නොවන වත්කම්** | | 436,810,042.25 | 463,181,826.94 |
| **ජංගම වත්කම්** | | | |
| ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම් | 5 | 11,155,660.60 | 6,082,105.22 |
| ලැබීම් - සේවක | 6 | 25,902,340.00 | 24,378,163.00 |
| ආයෝජන - කාලීන තැන්පත් | 7 | 42,053,092.41 | 38,317,490.30 |
| ආයෝජන - භාණ්ඩාගාර බිල්පත් | 8 | 14,935,680.00 | 13,823,174.00 |
| පොළී ආදායම් ලැබීම් | | 2,593,962.78 | 3,543,592.69 |
| මුදල් හා මුදල්සමාන දෑ | 9 | 517,262,715.21 | 532,294,890.61 |
| **මුලු ජංගම වත්කම්** | | **613,903,451.00** | **618,439,415.82** |
| **මුලු වත්කම්** | | **1,050,713,493.25** | **1,081,621,242.76** |
| **බැරකම්** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| රජයේ ප්‍රතිපාදන | 10 | 243,505,851.02 | 267,821,299.86 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 11 | 53,133,450.00 | 45,668,232.50 |
| **මුලු ජංගම නොවන බැරකම්** | | **296,639,301.02** | **313,489,532.36** |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු වියදම් | 12 | 1,870,484.93 | 62,552,668.92 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | | 57,231,404.00 | 59,703,404.00 |
| වෙන්කිරීම් හා උපචිත වියදම් | 13 | 109,132,088.18 | 39,141,068.79 |
| **මුලු ජංගම බැරකම්** | | **168,233,977.11** | **161,397,141.71** |
| **සමුච්චිත අරමුදල** | | **585,840,215.12** | **606,734,568.69** |
| **මුලු ශුද්ධ වත්කම් / හිමිකම්** | | **1,050,713,493.25** | **1,081,621,242.76** |

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රීලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කර ඇති බවට සහතික කරන ලදී.

..........................................

**අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන)**

මූල්‍ය ප්‍රකාශන වල අංක 05 සිට 08 දක්වා පිටු වල දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා අංක 09 සිට 15 දක්වා පිටු වල දක්වා ඇති සටහන් වලට අනුගතව සකස් කර ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකියනු ලැබේ.

.......................... ..........................

**සභාපති** **කොමිෂන් සභාවේ සාමාජික**

**දිනය: 2021.02.25**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් කාර්යඵලය පිළිබඳ ප්‍රකාශය | සටහන් | 2020 | 2019 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| **ආදායම** | 14 | 194,374,241.20 | 410,966,074.21 |
| වෙනත් අදායම් | 15 | 59,158,570.54 | 68,912,998.09 |
| **එකතුව** | | 253,532,811.74 | 479,879,072.30 |
| **වියදම්** | | | |
| **මෙහෙයුම් වියදම්** | 16 | | |
| සේවක පාරිශ්‍රමික | 16.1 | 155,120,686.63 | 152,466,003.42 |
| ප්‍රවාහන වියදම් | 16.2 | 12,870,202.08 | 17,686,303.64 |
| විශේෂ රැස්වීම් සඳහා වියදම් | | - | 39,000.00 |
| ප්‍රවාහන සංවර්ධන කාර්යයන් | 16.3 | 1,500,474.75 | 3,791,447.98 |
| ගමන් වියදම් සහයැපීම් දීමනා | 16.4 | 39,204,838.02 | 49,423,879.68 |
| ස්ථාවර වත්කම් අලුත්වැඩියා සහ නඩත්තු | 16.5 | 2,377,177.37 | 2,987,729.82 |
| සේවක සුභසාධනය | 16.6 | 7,086,600.54 | 12,209,422.63 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 16.7 | 632,618.72 | 1,148,026.35 |
| නීති හා වෙනත්ගාස්තු | 16.8 | 1,328,549.00 | 2,689,811.00 |
| සන්නිවේදන වියදම් | 16.9 | 759,279.00 | 1,119,008.75 |
| ක්ෂය වීම් | 16.10 | 26,955,712.19 | 25,290,793.67 |
| මුල්‍යගාස්තු | 16.11 | 39,174.18 | 51,186.52 |
| සේවක පාරිශ්‍රමික | 16.12 | 1,699,189.90 | 447,151.50 |
| **මුලු මෙහෙයුම් වියදම්** | | 249,574,502.38 | 269,349,764.96 |
| **වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)** | | 3,958,309.36 | 210,529,307.34 |
| **මෙහෙයුම් නොවන ආදායම්** | 17 | **15,430.00** | **40,175.00** |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය (ඌණතාවය)** | | 3,973,739.36 | 210,569,482.34 |
| **රජයෙන්ලැබුණු ප්‍රතිපාදන** | | | |
| ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රතිපාදන ලැබීම් | 18 | **401,999,970.00** | **581,750,000.00** |
| **විශේෂ ව්‍යාපෘති වියදම්** (රජයේ ප්‍රතිපාදන) | 19.1 | **(401,999,970.00)** | **(581,750,000.00)** |
| **විශේෂ ව්‍යාපෘති වියදම්** (ජාගකොස ප්‍රතිපාදන) | 19.2 | **(24,868,092.93)** | **(38,055,450.36)** |
| **වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)** | | -20,894,353.57 | 172,514,031.98 |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම/හිමිකම වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය**

| | **සමුච්චිත අතිරික්තය (ඌනතාවය)** |
|---|---|
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | 434,220,536.71 |
| අදාල වසර සඳහා අතිරික්තය/ ඌණතාවය | 172,514,031.98 |
| **2019 දෙසැම්බර් 31 දිනටශේෂය** | 606,734,568.69 |
| භාණ්ඩාගාරය වෙත හරවා යවන ලද මුදල් | - |
| අදාල වසර සඳහා අතිරික්තය/ ඌණතාවය | (20,894,353.57) |
| **2020 දෙසැම්බර් 31 දිනටශේෂය** | 585,840,215.12 |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| ජාතික ගමනාගමනකොමිෂන් සභාව | | (ශ්‍රී ලංකා රුපියල් වලිනි) | |
|---|---|---|---|
| **22020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය** | **සටහන්** | **2020** | **2019** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| වසර සඳහා අතිරික්තය / ඌණතාවය | | (20,894,353.57) | 172,514,031.98 |
| **මුදල් නොවන චලනයන්** | | | |
| ක්ෂය වීම් | | 26,955,712.19 | 25,290,793.67 |
| වත්කම් අපහරණය | | (15,430.00) | (40,175.00) |
| ක්‍රමක්ෂය | | (24,315,448.84) | (27,229,632.11) |
| වසර සඳහා පාරිතෝෂික වියදම | | 9,162,857.50 | 7,744,054.50 |
| පොළී අදායම | | (34,843,121.70) | (41,683,365.98) |
| **මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය - කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර** | | **(43,949,784.42)** | **136,595,707.06** |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම්** | | | |
| ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම් | | (5,073,555.38) | (2,308,620.91) |
| ලැබීම් - සේවක | | (1,524,177.00) | (1,515,388.00) |
| ලැබිය යුතු පොළී ආදායම | | 949,629.91 | (117,410.72) |
| ගෙවිය යුතු වියදම් | | (60,682,183.99) | (796,236.12) |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | | (2,472,000.00) | (6,015,500.00) |
| වෙන්කිරීම් හා උපචිත වියදම් | | 69,991,019.39 | 1,771,567.36 |
| **මෙහෙයුම් වලින් ජනිත වූ මුදල්** | | **(42,761,051.49)** | **127,614,118.67** |
| පාරිතෝෂික අරමුදල් ගෙවීම් | | (1,697,640.00) | (2,892,965.00) |
| වත්කම් අපහරණයෙන් ලද මුදල් | | 15,430.00 | 40,175.00 |
| **මෙහෙයුම්ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | **(44,443,261.49)** | **124,761,328.67** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (756,500.29) | (17,083,417.29) |
| කෙරීගෙන යන වැඩ | | 172,572.79 | (16,432,846.45) |
| පුස්තකාල පොත් අත්පත් කර ගැනීම | | - | (92,865.00) |
| කාලීන තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත් සඳහා ශුද්ධ ආයෝජන | | (4,848,108.11) | (4,543,069.21) |
| පොළී ලැබීම් | | 34,843,121.70 | 41,683,365.98 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | **29,411,086.09** | **3,531,168.03** |
| **මුල්‍ය ක්‍රියාකාරීත්වය තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| භාණ්ඩාගාරය වෙත හරවා යවන ලද මුදල් | | - | (50,000,000.00) |
| **වර්ෂය තුළ මුල්‍ය ක්‍රියාකාරීත්වය තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | - | **(50,000,000.00)** |
| **වර්ෂය තුළ මුදල් හා මුදල් සමාන දැහි ශුද්ධ වෙනස** | | **(15,032,175.40)** | **78,292,496.70** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | | 532,294,890.61 | 454,002,393.91 |
| **වර්ෂ අවසාන මුදල් සහ මුදල් සමාන දෑ** | **සටහන 09** | **517,262,715.21** | **532,294,890.61** |

සටහන

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

1 **ඒකාබද්ධ තොරතුරු**

**1.1 වාර්තාකරන ආයතනය**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 1991 අංක 37 දරණ ජාගකොස පනත යටතේ ස්ථාපනය කොට ඇත. කොමිෂන් සභාවේ කාර්යාලය සහ ගණුදෙනු සිදුකරනු ලබන ප්‍රධාන මධ්‍යස්ථානය කොළඹ 05 , උද්‍යාන පාරේ අංක 241 දරන ස්ථානයෙහි පිහිටුවා ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හී ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍යමය දත්ත ඇතුලත් වේ

**1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය**

කොමිෂන් සභාවේ කාර්යය වනු ඇත්තේ ඔම්නි බස් මගින් මගී ජනතාවට ප්‍රවාහන සේවාවන් සැලසීම පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් ලබාදීම සහ ඔම්නි බස් සඳහා නිශ්චය කර ගනු ලබන ප්‍රදේශ සඳහා මගී ප්‍රවාහන සේවා බලපත්‍ර නිකුත් කිරීම වේ.

**1.3** 2019 වර්ෂය අවසානය වන විට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ස්ථිර සේවක මණ්ඩලය 181 කි. එමෙන්ම කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 7 දෙනෙකු සේවය කර ඇත..

**1.4 වාර්තාකරන දිනය**

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ දිනය දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වේ.

**1.5 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය**

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය / සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධිකාරී බලය ලබා දී ඇත්තේ 2021.02.25 දිනය.

2 **වැදගත් ගිණුම්කරන පිළිවෙත්හි සාරාංශය**

**2.1 පිළියෙල කිරීමේ පදනම**

කොමිෂන් සභාවේ ගිණුම් පිළියෙල කරනු ලබන්නේ රාජ්‍ය අංශයේ ගිණුම් පිළිබඳ ප්‍රමිතීන් (SLPSASs) සහ පොදුවේ පිළිගනු ලබන ගිණුම්කරණ මූලධර්ම (LKAS 20) වලට අනුකූලවය. මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ ගත්මිල මත පදනම්ව වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා රජයේ ගිණුම් පිළිවෙත් අනුව ඇස්තමේන්තු මත සකස් කර ඇත. ඉහත සඳහන් ක්‍රියාවලි අනුව ආයතනයේ තොරතුරු, සටහන්, ඇස්තමේන්තු ගිණුම්ගත කිරීමේදී ගිණුම්කරණ ක්‍රියාවලියෙන් පරිබාහිර, විශේෂිත හා සංකීර්ණ වූ අවස්ථාවන් ගිණුම්කරණයට ලක් කිරීමේදී එම අවස්ථාවට යොදාගනු ලබන උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳව සටහන් අංක 3 මගින් දක්වා ඇත.

**2.2 ගිණුම් පිළිවෙත් වල වෙනස්කිරීම්**

පහත සඳහන් කර ඇති මූල්‍ය ප්‍රකාශන වල වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන කාල සීමාව සඳහා ක්‍රමාණුකූලව සඳහන් කර ඇත.

පවත්නා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා සසඳමින් වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම අදාල තැන්හි සංශෝධනය කර ඇත.

**2.3 විදේශ විනිමය පරිවර්තනය**

**2.3.1 මෙහෙයුම් සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය**

මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇති ගණුදෙනු සහ ශේෂය මනිනු ලබන්නේ ආයතනය මෙහෙය වනු ලබන ප්‍රාථමික ආර්ථික පරිසරය අනුවය. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

**2.3.2 ගණුදෙනු සහ ශේෂය**

විදේශ විනිමය ගණුදෙනු ක්‍රියාකාරකම් විනිමය ගණුදෙනු බවට පරිවර්තනය කරනුයේ ගණුදෙනු කරන දිනයේ පවත්නා විනිමය අනුපාතය මතය.

**2.4 දේපළ පිරියත උපකරන පිරිවැය**

දේපළ පිරියත උපකරන පිරිවැය යනු මිලදී ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීම සඳහා දරන ලද වියදම් වත්කම අපේක්ෂිත කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට දැරූ වියදම වේ .දේපළ පිරියත සහ යන්ත්‍ර උපකරණවල වටිනාකම දක්වන විටදී එය මිලදී ගැනීමට දැරූ මූලික වියදමින් මෙතෙක් ක්ෂයවීම් හා හානි අඩුකිරීමෙන් පසු ශුද්ධ වටිනාකම දක්වා ඇත.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......**

ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීමේ, වැඩිදියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ වියදම් හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ තත්ත්වයට පත් කිරීම දක්වා ගිණුම් වත්කම් තීරණය ලෙස සළකා ඇත. වත්කම් වලට අදාල නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කිරීම් වියදම් අදාල ආදායම් වියදම් ගිණුමට ලියාහැර ඇත.

ඉඩම් වටිනාකම ක්ෂයකිරීමට ලක් නොවන අතර අනෙකුත් වත්කම් ක්ෂයකිරීමට ලක් කිරීමේදී සරළ රේඛීය ක්ෂය ක්‍රමය යොදාගෙන ඇත. අදාල වත්කම් වල ආයුකාලය පහත පරිදි ගෙන ඇත.

| **වත්කම් වර්ගය** | **අවුරුද්ද** |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 05 තුල |
| ලී බඩු සහ සවිකිරීම් | වර්ෂ 10 තුළ |
| කාර්යාල උපකරණ | වර්ෂ 05 තුල |
| විවිධ උපකරණ | වර්ෂ 05 තුල |
| පරිගණක සහ මුද්‍රන යන්ත්‍ර | වර්ෂ 04 තුල |
| යන්ත්‍ර | වර්ෂ 05 තුල |
| ගොඩනැගිලි | වර්ෂ 20 තුල |
| විද්‍යුත් උපකරණ (LED) | වර්ෂ 03 තුල |

වත්කම් වල පොත් අගය එහි ඇස්තමේන්තුගත උපයා ගතහැකි අගයට වඩා වැඩි අගයක් ගන්නේ නම් එම වත්කම් වල පොත් අගය වහාම උපයාගත හැකි අගයට ලියාහරිනු ලැබේ.

**2.4.1 භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් මත කරන ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් සහ කාලීන තැන්පතු පිරිවැය අනුව සඳහන් කර ඇත.

**2.6 ලැබීම්**

ලැබීම් යනු ලබාගන්නා ලද සේවාවන් සඳහා ගෙවීමට ඇති මුදල් වේ. එකතුව සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී බලාපොරොත්තු වන අතර ලැබීම් වර්ගීකරණය කරනුයේ ජංගම වත්කම් ලෙසය. ලැබීම් හඳුනාගැනීම සහ මනිනු ලබන්නේ ගණුදෙනු කරන කරන වටිනාකම /අගය මතය.

**2.7 මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් හඳුන්වා ඇත්තේ අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු , බැංකුවල ඇති ක්ෂණික /ස්ථාවර තැන්පතු සහ පාරිතෝෂික අරමුදල්ය

**2.8 ගෙවීම්**

ගෙවීම් යනු භාණ්ඩ හා සේවා සපයන්නන් ලබාගත් භාණ්ඩ හා සේවා සඳහා අවශ්‍යයෙන් කළයුතු ගෙවීම් වේ. ගෙවීම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් කාලචක්‍රයේ කළ යුතු ගෙවීමක් නම් එය ජංගම වත්කමක් ලෙස වර්ග කරනු ලැබේ. (වසර 1 ක් හෝ ඊට අඩු) එසේ නොමැති අවස්ථාවල ඒවා ජංගම නොවන වත්කම් ලෙස හඳුන්වනු ලැබේ.
ගෙවීම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ ගණුදෙනු කරන මිලට අනුව වන අතර ඉන් පසුව ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී මෙම මිලට මිණුම් කරනු ලැබේ.

**2.9 රජයේ ප්‍රතිපාදන**

මූල්‍ය නොවන ප්‍රතිපාදන ඇතුලත්ව රජයෙන් ලැබෙන ප්‍රතිපාදන ඒවායෙහි සාධාරන වටිනාකම අනුව හඳුනාගනු ලැබේ.

දේපළ පිරියත සහ උපකරණ වලට අදාල රජයේ ප්‍රතිපාදන ජංගම නොවන වත්කම් වල රජයේ විලම්භිත ප්‍රතිපාදන යටතට ඇතුලත් කර ඇති අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී මෙය හඳුනාගනු ලබන්නේ අදාල වත්කම් වල අපේක්ෂිත ආයු කාලයේ සරළ රේඛීය පදනම මතය.

මූල්‍ය නොවන ප්‍රතිපාදන මූල්‍ය නොවන වත්කමෙහි ධාරණ වටිනාකම අනුව ගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකම අනුව ප්‍රතිපාදන ලබාදීම සහ වත්කම් ගණනය කරනු ලැබේ.

**2.10 මිලදී ගැනීමේ පිරිවැය**

මුදල් කාර්යඵලය පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ මිලදී ගන්නා ලද කාලය තුලය.

**2.11 සේවක ප්‍රතිලාභ**

කොමිෂන් සභාවට නිශ්චිත ප්‍රතිලාභ සහ නිශ්චිත දායකත්වය පිළිබඳ සැළසුම් ඇත

**(a) නිශ්චිත දායකත්ව සැලැස්ම**

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු කොමිෂන් සභාව මගින් ස්ථාවර දායකත්ව මුදලක් වෙනම අස්ථිත්වයක් වෙත ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි. මෙය පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මක් බැවින් තවදුරටත් ඒ සඳහා දායකත්ව මුදලක් ගෙවීම සඳහා කොමිෂන් සභාවට භෞතික හෝ අධ්‍යාත්මික බැදීමක් නොමැත. කල් පිරුණු පසු මෙම දායකත්ව මුදල් සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන් හඳුන්වනු ලැබේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් එක් සේවකයෙකුගෙන් දළ පාරිශ්‍රමික මුදලක් ලෙස 15% ක් බැර කරනු ලබන අතර සේවා නියුක්ති භාරකාර අරමුදලට 3% දළ පාරිශ්‍රමිකයක් අය කරනු ලැබේ.

**(b) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම**

සේවකයාගේ සේවා පළමු වර්ෂයේ සිට සේවය කරනු ලබන සෑම වර්ෂයකම මාස ½ ක වේතනය සේවක පාරිතෝෂික අරමුදලට බැර කිරීමට කටයුතු යොදා ඇත. කෙසේ වෙතත් 1983 පාරිතෝෂික අරමුදල ගෙවීමේ පනත් අංක 12 අනුව සේවකයෙකුට පාරිතෝෂික අරමුදලට හිමිකම් ලබාගත හැක්කේ වර්ෂ 05 අඛණ්ඩ සේවාවක් කිරීමෙනි.

**(c) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ**

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ පිළිබඳ වගකීම මනිනු ලබන්නේ සේවකයින් විසින් ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත වට්ටම් හෝ කරන ලද මුදලමය වටිනාකම මතය

**2.12 ප්‍රතිපාදන සහ අවිනිශ්චිත වගකීම්**

මෙහෙයුම් වියදම් සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලබන්නේ අතීතයේ සිදුකරන ලද සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් කොමිෂන් සභාවට වර්තමානයේ ඇති නෛතික බැදීම හෝ කොමිෂන් සභාවට අවශ්‍ය ආර්ථික සම්පත් පිටතට ගලායෑම සිදුවිය හැකි අතර විශ්වසනීය ලෙස එම ප්‍රමාණයන් ඇස්තමේන්තු ගත කල හැකිය.

පදනම් කරගෙන දැනට පවත්නා බැදීමද වගකීම පියවීම / නිරවුල් කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම අනුව ප්‍රතිපාදන මනිනු ලැබේ.

සියලුම අස්ථාවර වගකීම් මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහනක් ලෙස එළිදරවු නොකළහොත් සම්පත් පිටතට ගලායාමේ හැකියාව දුරස්ථ වනු ඇත.

**2.13 ආදායම හඳුනාගැනීම**

ආර්ථික ප්‍රතිලාභ සත්‍ය වශයෙන්ම ආයතනයට ගලා එන අවස්ථාවේදී ආදායම් වශයෙන් හඳුනාගැනීම. කොමිෂන් සභාව අදායම හඳුනාගනු ලබන්නේ ආදායම් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම මැනිය හැකි අවස්ථාව සහ ඉදිරියේදී කොමිෂන් සභාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි සම්භාවිතාව අනුවය.

කොමිෂන් සභාව විසින් ආදායම හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන නිර්ණායක හඳුනාගත හැක. ඒ ඒ ප්‍රධාන මාර්ග වල ආදායම මැනීම සඳහා ආදේශ කර ඇත.

**(a) බලපත්‍ර ආදායම**

මාර්ග බලපත්‍ර වලින් ලැබෙන අදායම හඳුනාගනු ලබන්නේ කොමිෂන් සභාව වෙත අනාගතයේ ආර්ථික ප්‍රතිලාභ සැලැස්මට ඇති හැකියාව මතය.

**(b) දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමේදි ඇති ලාභ සහ අලාභ**

බැහැර කිරීමේදී ඇති ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ලත් මුදල් / උත්පාදන මුදල් ධාරන පිරිවැයත් සමඟ සන්සන්දනය කිරීමෙනි. මෙය මුදල් කාර්යඵල ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

**2.14 වියදම්**

මෙහෙයුම් කරන කාලසීමාවෙදී දරන ලද වියදම් යනු වාර්තාකරන කාලයේදී ලාභය ලෙස ලැබෙන ආදායමයි.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......**

**2.15 ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සිදුවීම්**

ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවන ද්‍රව්‍යමය සිදුවීම් සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය තැන්වල සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

**2.16 වගකීම්**

ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සියලුම ද්‍රව්‍යමය වගකීම් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් කිරීම මගින් අනාවරණය කර ඇත.

**3. වැදගත් ගිණුම්කරණ පිළිවෙත් (නිමාන) සහ විනිශ්චයන්**

මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වය මගින් විනිශ්චයන් ගණනාවක් යොදාගනු ලබන අතර වත්කම්, වගකීම්, ආදායම සහ වියදම හඳුනාගැනීම සහ මැනීම සඳහා තක්සේරු (නිමාන) සහ උපකල්පන රාශියක් උපයෝගී කරගනු ලබයි.

මැනීමට යන හඳුනාගැනිම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරන තක්සේරු /පළාත් සහ උපකල්පන පිළිබඳ තොරතුරු පහත දක්වා ඇති පරිදි වේ:

(a) **ක්ෂය වීගෙන යන වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය**

වත්කමේ අපේක්ෂිත ආර්ථික උපයෝගිතාවය මත ශේෂ පත්‍ර දිනයට ක්ෂය වන වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තක්සේරු කරනු ලබන බව කළමණාකාරීත්වය සමාලෝචනයෙහි දක්වා ඇත. මෙම අස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයන්ට හේතුව ඇතැම් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණික උපාංග වල උපයෝගීතාවය වෙනස් කිරීමට ඉවහල් වන යල්පැන ගිය තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමය.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......**

4 දේපළ පිරියත සහ උපකරණ

සින්නක්කර වත්කම් - පිරිවැය

| අංක | වත්කම් පංතිය | පිරිවැය | | | | ක්ෂය ප්‍රතිශතය | ක්ෂය කිරීම් | | | | ශේෂය 2020 | ශේෂය 2019 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2020.01.01 දිනට ශේෂය | අපහරනය කිරීම් | වසර තුළදී එකතු කිරීම් | 2020.12.31 දිනට ශේෂය | | 2020.01.01 දිනට ශේෂය | අපහරනය කිරීම් | වසර තුළදී එකතු කිරීම් | 2020.12.31 දිනට ශේෂය | | |
| 1 | ඉඩම් | 245,000,000.00 | | - | 245,000,000.00 | - | - | | - | - | 245,000,000.00 | 245,000,000.00 |
| 2 | ගොඩනැගිලි | 195,683,739.57 | | - | 195,683,739.57 | 5% | 70,009,732.04 | | 9,348,666.60 | 79,358,398.64 | 116,325,340.93 | 125,674,007.53 |
| 3 | මෝටර් වාහන | 75,547,270.00 | | - | 75,547,270.00 | 20% | 68,709,249.10 | | 420,000.00 | 69,129,249.10 | 6,418,020.90 | 6,838,020.90 |
| 4 | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 35,684,150.92 | 330,211.65 | 172,115.50 | 35,526,054.77 | 10% | 23,463,393.33 | 330,211.65 | 2,929,842.60 | 26,063,024.28 | 9,463,030.49 | 12,220,757.59 |
| 5 | කාර්යාල උපකරණ | 25,306,451.13 | | 79,500.00 | 25,385,951.13 | 20% | 13,859,286.95 | | 2,980,320.03 | 16,839,606.98 | 8,546,344.15 | 11,447,164.18 |
| 6 | විවිධ උපකරණ | 8,941,437.55 | | 232,407.00 | 9,173,844.55 | 20% | 4,593,898.42 | | 1,052,040.99 | 5,645,939.41 | 3,527,905.14 | 4,347,539.13 |
| 7 | පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර | 67,676,597.93 | | 272,477.79 | 67,949,075.72 | 25% | 41,966,961.02 | | 10,224,841.97 | 52,191,802.99 | 15,757,272.73 | 25,709,636.91 |
| 8 | යන්ත්‍රෝපකරණ | 1,775,637.00 | | - | 1,775,637.00 | 20% | 1,775,637.00 | | - | 1,775,637.00 | - | - |
| 9 | විද්‍යුත් ප්‍රදර්ශන නාමපුවරු | 62,415,360.00 | | - | 62,415,360.00 | 33.33% | 62,415,360.00 | | - | 62,415,360.00 | - | - |
| | Total | **718,030,644.10** | **330,211.65** | **756,500.29** | **718,456,932.74** | | **286,793,517.86** | **330,211.65** | **26,955,712.19** | **313,419,018.40** | **405,037,914.34** | **431,237,126.24** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| 12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | | | 2020 | 2019 |
|---|---|---|---|---|
| **5** | **ලැබියයුතු, තැන්පතු සහ අත්තිකාරම්** | | | |
| | ලැබියයුතු | **සටහන 5.1** | 9,032,500.27 | 4,297,274.17 |
| | තැන්පතු සහ අත්තිකාරම් | **සටහන 5.2** | 2,123,160.33 | 1,784,831.05 |
| | | | **11,155,660.60** | **6,082,105.22** |
| | **5.1 ලැබියයුතු** | | | |
| | ලැබිය යුතු ආදායම් | | 9,011,594.77 | 3,958,088.00 |
| | මැතිවරණ දෙපාර්තමෙන්තුව | | - | 83,898.00 |
| | වෙනත් ලැබිය යුතු | | 20,905.50 | 255,288.17 |
| | | | **9,032,500.27** | **4,297,274.17** |
| | **5.2 තැන්පතු සහ අත්තිකාරම්** | | | |
| | තැන්පතු | | 686,500.00 | 686,500.00 |
| | අත්තිකාරම් - ව්‍යාපෘති | | - | 37,616.00 |
| | අත්තිකාරම් - ජාගකොස | | 61,380.00 | 55,000.00 |
| | අත්තිකාරම් ගෙවීම් | | 1,375,280.33 | 1,005,715.05 |
| | | | **2,123,160.33** | **1,784,831.05** |
| **6** | **ලැබියයුතු - සේවක** | | | |
| | ආපදා ණය | | 25,874,140.00 | 23,383,870.00 |
| | ආපදා ණය | | - | 214,593.00 |
| | රෙදිපිළි සඳහා අත්තිකාරම් | | 20,200.00 | 469,200.00 |
| | උත්සව අත්තිකාරම් | | 8,000.00 | 310,500.00 |
| | | | **25,902,340.00** | **24,378,163.00** |
| **7** | **ආයෝජන - කාලීන තැන්පතු** | | | |
| | කාලීනතැන්පතු | | 42,053,092.41 | 38,317,490.30 |
| | | | **42,053,092.41** | **38,317,490.30** |

පාරිතෝෂික වගකීම සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.41,133,092.410 (2019-37,397,490.30)

| | | | | |
|---|---|---|---|---|
| **8** | **ආයෝජන - භාණ්ඩාගාර බිල්පත්** | | | |
| | භාණ්ඩාගාර බිල්පත් | | 14,935,680.00 | 13,823,174.00 |
| | | | **14,935,680.00** | **13,823,174.00** |

පාරිතෝෂික වගකීම සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.14,935,680.00 (2019-13,823,174.00)

| | | | | |
|---|---|---|---|---|
| **9** | **මුදල් හා මුදල්සමාන දෑ** | | | |
| | මුදල් -අතැති | **සටහන 9.1** | 155,820.00 | 2,811,789.83 |
| | මුදල් - බැංකු | **සටහන 9.2** | 796,473.34 | 563,528.37 |
| | කෙටිකාලීන තැන්පතු | **සටහන 9.3** | 516,310,421.87 | 528,919,572.41 |
| | **මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් හා මුදල් සමාන දෑ** | | **517,262,715.21** | **532,294,890.61** |
| | **9.1 මුදල්- අතැති** | | | |
| | අතැති මුදල් | | 80,820.00 | 397,524.06 |
| | චෙක්පත් | | - | 2,339,265.77 |
| | සුළු මුදල් අග්‍රිමය | | 75,000.00 | 75,000.00 |
| | | | **155,820.00** | **2,811,789.83** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | | | 2020 | 2019 |
|---|---|---|---|---|
| | **9.2 මුදල් - බැංකු** | | | |
| | මහජන බැංකුව -නාරාහේන්පිට | | 744,847.27 | 496,518.37 |
| | මහජන බැංකුව -නාරාහේන්පිට ( ආසන වෙන් කිරීම්) | | 51,626.07 | 67,010.00 |
| | | | **796,473.34** | **563,528.37** |
| | **9.3 කෙටි කාලීන තැන්පතු** | | | |
| | කෙටිකාලීන ආයෝජන සහ කැඳවුම් තැන්පතු | | 65,668,245.22 | 61,292,527.90 |
| | ආයෝජන- රෙපෝ | | 450,261,379.54 | 467,312,284.67 |
| | ඉතිරිකිරීමේ ගිණුම - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | 380,797.11 | 314,759.84 |
| | | | **516,310,421.87** | **528,919,572.41** |

පාරිතෝෂික වගකීම සඳහා වෙනම පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පතු මුදල රු.380,797.11 (2019-314,759.84) .

| | | | | |
|---|---|---|---|---|
| 10 | **රජයේ ප්‍රදාන** | | | |
| | **ජනවාරි 01දිනට ශේෂය** | | **267,821,299.86** | **295,050,931.97** |
| | වසර තුළ ප්‍රදාන ලැබීම් | | - | - |
| | රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | | (24,315,448.84) | (27,229,632.11) |
| | **දෙසැම්බර් 31ට ශේෂය** | | **243,505,851.02** | **267,821,299.86** |

අංක.241 උද්‍යාගන පාර, නාරාහේන්පිට පිහිටි ඉඩම ශ්‍රී ලංකා රජයෙන් ලද මූල්‍ය නොවන රජයේ ප්‍රදානයක් ලෙස හඳුනාගෙන ප්‍රදානය ලද අවස්ථාවේ වෙළඳපොල අගයට වත්කම් සටහන් කරගන්නා ලද අතර ගොඩනැගිලිවල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමක්ෂය කරන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| 11 | **ගෙවියයුතු විශ්‍රාමික ප්‍රතිලාභ** | | | |
| | **ජනවාරි 01 දිනට ශේෂය** | | 45,668,232.50 | 40,817,143.00 |
| | වසර තුළ හඳුනාගත් වියදම් | | 9,162,857.50 | 7,744,054.50 |
| | වසර තුළ කරන ලද ගෙවීම් | | -1,697,640.00 | (2,892,965.00) |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **53,133,450.00** | **45,668,232.50** |
| 12 | **ගෙවිය යුතු** | | | |
| | කුලියට ගැනීම් | | 47,071.79 | 44,293.79 |
| | මුද්දර ගාස්තු | | 28,375.00 | 15,500.00 |
| | රක්ෂණ | | 379.00 | 379.00 |
| | උපයන විට ගෙවීමේ බදු | | 27,418.00 | 23,218.00 |
| | විවිධ ණයහිමියෝ | | 62,405.00 | 12,215,182.19 |
| | ආදායම් කලට පෙර ලැබීම් | | - | 41,329,368.55 |
| | වෙනත් ගෙවියයුතු | | 851,944.27 | 777,774.69 |
| | EPF ගෙවිය යුතු | | 61,702.50 | - |
| | ETF ගෙවිය යුතු | | 7,404.30 | - |
| | බැංකු ණය සහ තැන්පතු | | 10,729.00 | 23,600.00 |
| | ආසන වෙන් කිරීම සඳහා ගෙවියයුතු | | 11,266.07 | 26,650.00 |
| | ලංසු සුරක්ෂණ | | - | 4,896,212.70 |
| | කාර්යසාධන සුරක්ෂණ | | - | 2,438,700.00 |
| | BIA ගේට්වේ ව්‍යාපෘතිය | | 761,790.00 | 761,790.00 |
| | තිරසර පාසල් ව්‍යාපෘතිය | | - | - |
| | | | **1,870,484.93** | **62,552,668.92** |
| 13 | **වෙන් කිරීම් සහ උපචිත වියදම්** | | | |
| | උපචිත වියදම් - ව්‍යාපෘති | **සටහන 13.1** | 89,678,696.58 | 24,240,960.37 |
| | උපචිත වියදම් - පුනරාවර්තන | **සටහන 13.2** | 17,977,365.60 | 13,570,082.42 |
| | විගණන ගාස්තු වෙන් කිරීම් | | 1,476,026.00 | 1,330,026.00 |
| | | | **109,132,088.18** | **39,141,068.79** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| 12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 2020 | 2019 |
|---|---|---|
| **13.1 උපචිත වියදම් - ව්‍යාපෘති** | | |
| **පුනරාවර්තන** | | |
| සමාජයීය සුභසාධන බස් සේවා සඳහා දායකත්වය | 87,026,249.19 | 17,991,665.44 |
| පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ | 237,999.96 | 311,752.00 |
| ගුණාත්මය හා ගාස්තු නියාමනය | 1,581,009.92 | 2,102,005.33 |
| ජාගකොස /ප්‍රවාහන අධිකාරි ඇතුළු ප්‍රවාහනයට සෘජුව සම්බන්ධ ආයතනවල නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් | 0.00 | 246,747.30 |
| ප්‍රවාහනය ආශ්‍රිත පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 77,470.00 | 120,978.08 |
| ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛණ වාර්තාව | | 1,433,997.00 |
| | **88,922,729.07** | **22,207,145.15** |
| **ප්‍රාග්ධන** | | |
| පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ | 755,967.51 | 2,033,815.22 |
| | **755,967.51** | **2,033,815.22** |
| | **89,678,696.58** | **24,240,960.37** |

| | 2020 | 2019 |
|---|---|---|
| **13.2 උපචිත වියදම් - පුනරාවර්තන** | | |
| පිරිසිදු කිරීමේ සේවා | 702,534.78 | 1,236,932.58 |
| සන්නිවේදන | 354,392.45 | 257,121.59 |
| විදුලිය සහ බලය | 582,381.65 | 631,382.77 |
| සේවක සුභසාධන | 3,255,054.70 | 180.00 |
| සේවක වෛද්‍යාධාර ක්‍රමය | 5,000.00 | 7,500.00 |
| EPF | - | 58,011.00 |
| ETF | - | 6,961.32 |
| ඉන්ධන සහ ලිහිසි | 330,075.58 | 304,517.88 |
| නිවාඩු දින දීමනා -විධායක | - | 67,658.00 |
| භාෂා දීමනා | 260.00 | 487.00 |
| නීති ගාස්තු | 223,600.00 | 290,500.00 |
| ගමන් වියදම් - දේශීය | 63,962.50 | 39,257.50 |
| මෝටර් රථ අළුත්වැඩියාව | 334,118.39 | 254,811.74 |
| කාර්යාල උපකරණ නඩත්තු | 35,429.00 | 34,347.49 |
| වෘත්තීය ආයතන සාමාජික ගාස්තු | 21,000.00 | 12,500.00 |
| රැස්වීම් සඳහා ආහාරපාන | 8,615.00 | 3,690.00 |
| පුවත්පත් සහ සඟරා | 57,040.00 | 55,960.00 |
| කාර්යාලයීය අවශ්‍යතා | 395,580.00 | 145,554.00 |
| විවිධ වියදම් | 84,449.00 | - |
| අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන | 913,034.00 | 1,215,867.00 |
| පුවත්පත් දැන්වීම් | 19,440.00 | - |
| වැටුප් හා වේතන | 221,954.00 | 208,664.60 |
| ආරක්ෂක සේවා | 2,220,904.17 | 1,513,350.00 |
| කාර්ය මණ්ඩල පුහුණු | 45,336.74 | 44,500.00 |
| ප්‍රවාහන සහ කුලී ගාස්තු | 187,539.00 | 496,800.00 |
| ජලය | 36,120.10 | 56,213.69 |
| ලදුපත් මත මුද්දර ගාස්තු | 2,825.00 | 17,825.00 |
| | **17,977,365.60** | **13,570,082.42** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | | 2020 | 2019 |
|---|---|---|---|
| 14 | **ආදායම** | | |
| | **14.1 බලපත්‍ර ආදායම්** | | |
| | මාර්ග බලපත්‍ර ආදායම | 30,000.00 | 440,000.00 |
| | බලපත්‍ර අළුත්කිරීමේ ආදායම | 10,987,836.00 | 21,432,500.00 |
| | මාර්ග ටෙන්ඩර් ආදායම | 131,819,474.05 | 307,815,617.95 |
| | | **142,837,310.05** | **329,688,117.95** |
| | **14.2 වෙනත් ආදායම්** | | |
| | පරිපාලන ආදායම් | 14,666,500.00 | 35,330,347.24 |
| | බැස්ටියන් මාවත වැසිකිළි ආදායම | 9,590,221.02 | 9,480,746.27 |
| | විවිධ ආදායම් | 27,280,210.13 | 36,466,862.75 |
| | | **51,536,931.15** | **81,277,956.26** |
| | **මුළු ආදායම** | **194,374,241.20** | **410,966,074.21** |
| | **ලංසු සුරක්ෂණ රු. 4,896,212.70 හා කාර්යසාධන සුරක්ෂණ රු. 2,438,700.00** | | |

2020 වර්ෂයේදී කිලිනොච්චි බස් පර්යන්තය උතුරු පළාත් සභාවට භාර දීමෙන් පසු ලංසු සුරක්ෂණය හා කාර්යසාධන සුරක්ෂණය ආදායම් වශයෙන් හඳුනා ගන්නා ලදී.

| | | 2020 | 2019 |
|---|---|---|---|
| 15 | **වෙනත් ආදායම්** | | |
| | **15.1 පොළී ආදායම** | | |
| | තැන්පතු මත පොළිය | 33,943,089.70 | 40,742,207.98 |
| | ආපදා-ණය පොළිය | 900,032.00 | 941,158.00 |
| | | **34,843,121.70** | **41,683,365.98** |
| | **15.2 වෙනත්** | | |
| | රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය | 24,315,448.84 | 27,229,632.11 |
| | | **24,315,448.84** | **27,229,632.11** |
| | | **59,158,570.54** | **68,912,998.09** |

| | | 2020 | 2019 |
|---|---|---|---|
| 16 | **මෙහෙයුම් වියදම්** | | |
| | **16.1 සේවක මණ්ඩල වියදම්** | | |
| | වැටුප් හා වේතන | 87,241,658.40 | 81,424,350.52 |
| | ජීවන වියදම් දීමනාව | 17,079,388.00 | 17,671,544.00 |
| | වෘතීය දීමනා | 665,613.00 | 655,807.00 |
| | භාෂා දීමනාව | 281,149.00 | 292,229.60 |
| | සේවක අර්ථසාධක අරමුදල් | 15,768,117.66 | 14,809,251.45 |
| | සේවක භාරකාර අරමුදල | 3,153,623.53 | 2,969,183.09 |
| | නිවාඩු දින දීමනා -විධායක | 707,293.00 | 1,290,504.00 |
| | අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන | 10,341,317.00 | 16,030,244.00 |
| | පාවිච්චියට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 8,030,919.54 | 6,824,177.26 |
| | පාරිතෝෂික | 9,162,857.50 | 7,744,054.50 |
| | ප්‍රසාද දීමනා | 2,688,750.00 | 2,754,658.00 |
| | | **155,120,686.63** | **152,466,003.42** |
| | **16.2 ප්‍රවාහන** | | |
| | මෝටර්රථ අළුත්වැඩියා සහ නඩත්තු | 3,982,200.81 | 4,126,839.61 |
| | ඉන්ධන සහ ලිහිසි | 3,565,232.74 | 4,671,814.14 |
| | ප්‍රවාහන සහ කුලී ගාස්තු | 4,254,930.65 | 7,782,647.50 |
| | බලපත්‍ර සහ රක්ෂණ | 1,067,837.88 | 1,105,002.39 |
| | | **12,870,202.08** | **17,686,303.64** |
| | **16.3 ගමන් වියදම් හා යැපීම් දීමනා** | | |
| | විදේශ ගමන් වියදම් | - | 7,400.00 |
| | දේශීය ගමන් වියදම් | 1,500,474.75 | 3,784,047.98 |
| | | **1,500,474.75** | **3,791,447.98** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| 12.31 දිනෙන් අවසන් වර්ෂයේමූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 2020 | 2019 |
|---|---|---|
| **16.4 සේවා ස්ථාන වියදම්** | | |
| කාර්යාලයීය අවශ්‍යතා (ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ) | 2,730,152.81 | 5,865,410.29 |
| පිරිසිදු කිරීම් | 8,973,639.44 | 12,933,169.21 |
| වරිපනම් හා බදු | 374,220.00 | 288,288.00 |
| ආරක්ෂක සේවා | 14,641,266.94 | 15,463,832.47 |
| විදුලිය සහ බලය | 7,540,440.70 | 9,413,417.16 |
| ජලය | 452,260.40 | 610,202.72 |
| අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | 853,400.00 | 817,000.00 |
| රැස්වීම් සඳහා ආහාරපාන | 222,800.86 | 361,163.20 |
| මාර්ගස්ථ මුදල් රක්ෂණය | 44,166.77 | 51,874.76 |
| සන්නිවේදන | 3,372,490.10 | 3,619,521.87 |
| | **39,204,838.02** | **49,423,879.68** |
| **16.5 ස්ථාවර වත්කම් අළුත්වැඩියා සහ නඩත්තු** | | |
| ගොඩනැගිලි අළුත්වැඩියාව | 363,426.50 | 821,293.37 |
| කාර්යාලයීය උපකරණ **අළුත්වැඩියාව** | 1,955,254.94 | 2,084,300.00 |
| පරිගණක සහ උපාංග **අළුත්වැඩියාව** | 58,495.93 | 82,136.45 |
| | **2,377,177.37** | **2,987,729.82** |
| **16.6 සේවක සුභසාධනය** | | |
| සේවක වෛද්‍යාධාර ක්‍රමය | 333,000.00 | 289,800.00 |
| සේවක සුභසාධනය | 6,744,070.54 | 11,054,890.63 |
| නිල ඇඳුම් | 9,530.00 | 864,732.00 |
| | **7,086,600.54** | **12,209,422.63** |
| **16.7 සේවක සංවර්ධනය** | | |
| සේවක පුහුණු කිරීම් | 432,190.00 | 971,594.00 |
| වෘත්තීය ආයතන සාමාජික ගාස්තු | 200,428.72 | 176,432.35 |
| | **632,618.72** | **1,148,026.35** |
| **16.8 නීති ගාස්තු සහ වෙනත්** | | |
| විගණන ගාස්තු | 650,000.00 | 601,000.00 |
| නීති ගාස්තු | 678,549.00 | 2,088,811.00 |
| | **1,328,549.00** | **2,689,811.00** |
| **16.9 තොරතුරු** | | |
| පුවත්පත් දැන්වීම් | 661,969.00 | 966,948.75 |
| පුවත්පත් සහ සඟරා | 97,310.00 | 152,060.00 |
| | **759,279.00** | **1,119,008.75** |
| **16.10 ක්ෂය** | | |
| ගොඩනැගිලි | 9,348,666.60 | 9,487,724.66 |
| මෝටර් වාහන | 420,000.00 | 2,250,000.00 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 2,929,842.60 | 3,037,376.03 |
| කාර්යාලයීය උපකරණ | 2,980,320.03 | 2,883,035.44 |
| විවිධ උපකරණ | 1,052,040.99 | 1,316,217.72 |
| පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර | 10,224,841.97 | 6,315,979.42 |
| යන්ත්‍රෝපකරණ | - | 460.40 |
| | 26,955,712.19 | 25,290,793.67 |
| **16.11 මූල්‍ය ගාස්තු** | | |
| බැංකු ගාස්තු | 39,174.18 | 51,186.52 |
| | **39,174.18** | **51,186.52** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

| 12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | | 2020 | 2019 |
|---|---|---|---|
| | **16.12 වෙනත් වියදම්** | | |
| | විවිධ වියදම් | 1,681,689.90 | 383,251.50 |
| | ලදුපත් සඳහා මුද්දර ගාස්තු | 17,500.00 | 63,900.00 |
| | | **1,699,189.90** | **447,151.50** |
| 17 | **මෙහෙයුම් නොවන ආදායම්** | | |
| | අපහරණය කළ වත්කම් | 15,430.00 | 40,175.00 |
| | | **15,430.00** | **40,175.00** |
| 18 | **ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන** | | |
| | ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන- පුනරාවර්තන | 401,999,970.00 | 581,750,000.00 |
| | | **401,999,970.00** | **581,750,000.00** |
| 19 | **19.1 රජයේ ප්‍රදාන මත විශේෂ ව්‍යාපෘති වියදම්** | | |
| | ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන | 401,999,970.00 | 581,750,000.00 |
| | | **401,999,970.00** | **581,750,000.00** |
| | **19.2 ජාගකොස අරමුදල් මත විශේෂ ව්‍යාපෘති වියදම්** | | |
| | ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන | 20,626,255.00 | 26,950,120.15 |
| | ව්‍යාපෘති වියදම් -ප්‍රාග්ධන | 4,241,837.93 | 11,105,330.21 |
| | | **24,868,092.93** | **38,055,450.36** |

**2019.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

ශ්‍රී ලංකා රාජ්‍ය ගිනුම්කරණ ප්‍රමිත අංක 3 අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු හා වැරදීම් සඳහා කරන ලද ගැලපීම් පහත පරිදි වේ.

01) 2018 වර්ෂය සඳහා ලද රු.1,467,427.50 ක බැස්ටියන් මාවත වැසිකිලි ආදායම ලැබිය යුතු ආදායම් ගිණුම බැර කිරීම මගින් බැස්ටියන් මාවත වැසිකිලි ආදායම් ගිණුමෙන් ඉවත් කිරීම.

02) 2018 වර්ෂය සඳහා ලද රු.520,000.00 ක විද්‍යුත් ප්‍රදර්ශන නාමපුවරු ආදායම ලැබිය යුතු ආදායම් ගිණුම බැර කිරීම මගින් විවිධ ආදායම් ගිණුමෙන් ඉවත් කිරීම.

03) 2018 වර්ෂය සඳහා ලද රු.25,100.00 ක වත්කම් අපහරණය කිරීමේ ආදායම ලැබිය යුතු ආදායම් ගිණුම බැර කිරීම මගින් විවිධ ආදායම් ගිණුමෙන් ඉවත් කිරීම.

04) 2019 දෙසැම්බර් මාසයට අදාල ප්‍රවේශ පත්‍ර වෙන් කිරීමේ ආදායම (මාර්ගගත) රු.13,950.00 ක් වශයෙන් හඳුනා ගැනීම හා ආසන වෙන් කිරීම සඳහා ගෙවියයුතු ගිණුමෙන් ඉවත් කිරීම.

05) සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල රු.34,806.00ක් හා රු.6,589.84ක් වැරදි ලෙස සටහන් වීම නිවැරදි කිරීම.

06) 2019 වර්ෂයට අදාලව හඳුනා ගන්නා ලද පිළිවෙලින් රු.487.00, රු.67,658.00, හා රු.1,215,867.00 ක් වූ භාෂා දීමනාව, නිවාඩු දින දීමනා -විධායක හා අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන වියදම්, අදාල වියදම් ගිණුම හර කිරීම හා උපචිත වියදම් ගිණුම බැර කිරීම.

07) හඳුනා ගන්නා ලද උපදේශන වියදම් සඳහා වැඩියෙන් වෙන් කිරීම් රු.17,981.66 ආයතනික ධාරිතාව නැංවීමේ ව්‍යාපෘති වියදම් ගිණුම බැර කිරීම මගින් විවිධ ණය හිමියෝ ගිණුමෙන් ඉවත් කිරීම.

08) පුනරාවර්තන වියදම් වශයෙන් හඳුනා ගන්නා ලද රු.2,781,161.06 ක් ආයතනික ධාරිතාව නැංවීමේ ව්‍යාපෘති වියදම් ගිණුම හර කිරීම මගින් ගොඩනැගිලි ගිණුමෙන් ඉවත් කිරීම.

09) රු.2,781,161.06ක් වූ ගොඩනැගිලි පිරිවැය මත වැඩිපුර සිදු කරන ලද ක්ෂය වෙන් කිරීම රු.139,058.05 ක් වූ ගොඩනැගිලි සඳහා වැඩිපුර ක්ෂය වෙන් කිරීම ඉවත් කිරීම.

2019 මූල්‍ය ප්‍රකාශන වලට අදාලව ඉහත කරන ලද ගැලපීම් මත 2019 වර්ෂයේ ශුද්ධ අතිරික්තය / ඌනතාවය රු.178,379,346.39 සිට රු.172,514,031.98 දක්වා පහළ යන ලදී.

මෙම ගැලපීම් වල ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත අතිරික්තය / ඌණතාවය රු.612,599,883.10 සිට රු.606,734,568.69 දක්වා පහළ යන ලදී.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
සිටිපී/ඒ/එන්ටීසී/එෆ්ඒ/01/2020/130

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2021 ජූලි 30 දින

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

**ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 තත්වාගණනය කල මතය සදහා පදනම**

(අ) පෙර වර්ෂයේ ගොඩනැගිලි නඩත්තු වියදම් ප්‍රාග්ධනිත කිරීමේ වරද නිවරදි කිරීමේදී එම නඩත්තු වියදමට ගලපා තිබුණු රු. 1,139,058 ක් වූ ක්ෂය වටිනාකම, ප්‍රවර්ථන වර්ෂයේ ක්ෂය වියදමෙන් අඩුකර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) කොමිෂමේ අරමුදල් යොදා ගනිමින් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ වැයකරන ලද රු24,868,093ක් රජයේ ප්‍රදාන යටතේ වියදමක් ලෙස ශුද්ධ ලාභයට පසුව ගලපා ඉදිරිපත් කර තිබුණි. මෙම විශේෂ ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබන කෙරීගෙන යන වැඩ සඳහා වැය කර තිබුණු රු.4,241,838ක්ද අයහාර වියදමක් ලෙස සලකා ආදායමට ලියාහැර තිබීම නිසා කොමිෂන් සභාවේ ලාභය හා කෙරීගෙන යන වැඩ එම වටිනාකමෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසු මට ලබාදීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

3

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාධන ඇතුලත් වේ.

2.1.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදය යටතේ දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂමේ පාලක මණ්ඩලය විසින් විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

5

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 1978 දෙසැම්බර් 18 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් වත්කම් වල වටිනාකම වාර්ෂික ක්ෂය වීම, අගය වැඩිවීම් හෝ අපහරණය කිරීම පිළිබඳව පරීක්ෂා කල හැකි වන පරිදි වෙන් වෙන්ව සටහන් කර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වෙනි වගන්තිය හා අංක : පීඊඩී 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| I. 8.2.2 ඡේදය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ආයතනය විසින් රු.42,053,092 ස්ථාවර තැන්පත් හා රු.14,935,680 භාණ්ඩාගාර බිල්පත්හි 2020 දෙසැම්බර් 31 දිනට ආයෝජනය කර තිබුණි. තවද එදිනට රු.516,310,421ක් කෙටි කාලීන අයෝජනවලද යොදවා තිබුණි. |
| II. 8.3.9 ඡේදය | අදාල රේඛීය අමාත්‍යංශය හෝ අනෙකුත් රාජ්‍ය ආයතන වෙනුවෙන් රාජ්‍ය ව්‍යාපාර විසින් වියදම් දැරීම හෝ ඔවුන් සතු මානව සම්පත් ඇතුළුව අනෙකුත් සම්පත් යෙදවීම සිදු නොකල යුතු වුවද,කොමිෂන් සභාව විසින් කළමනාකරණ සහකාරිනියක් 2020 ඔක්තෝම්බර් 12 දින සිට ප්‍රවාහන අමාත්‍යංශයේ සේවයට මුදා හැර සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.442,932 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| III. 9.1.2 ඡේදය | ආයතන සුභසාධන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සේවක රක්ෂණ හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා රු.6,744,070 ක් වැයකර තිබුණි. |
| (ඇ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 (2) (ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයකට සීමා විය යුතු වුවද, එම සීමාව ඉක්මවමින් 2020 වර්ෂය තුල අවස්ථා 7 කදී, එකතුව රු.1,678,155 ප්‍රමාණයක් අත්තිකාරම් ලබාදී තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 9 වන වගන්තියේ කොමිෂන් සභා කර්තව්‍යය යටතේ මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීම හා පනතේ 24 වන වගන්තිය අනුව අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද කොමිෂන් සභා පනතේ මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයන් හඳුන්වා දී නොතිබුණි. තවද විගණිත දින වන 2021 මාර්තු මස වන විටද කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලස්වමින් ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) කොරෝනා වසංගතයෙන් අඩපණ වූ අන්තර් පළාත් බස් රථ ධාවන කටයුතු යථා තත්වයට පත් කිරීම සඳහා සහන ලබා දීමේදී කැබිනට් අනුමැතිය ලැබීමටත් පෙර ගෙවිය යුතු සියලුම ප්‍රමාද ගාස්තු, ටෙන්ඩර් ගාස්තු යාවත්කාලීන කිරීම් ගාස්තු, ලොග් පත්‍ර පිවිසුම් පත්‍ර ගාස්තු නිදහස් කිරීමට කොමිෂන් සභාව විසින් ඒකමතිකව තීරණය කර තිබුණි. එම තීරණය නිසා

2020 වසරේ ආයතනයට අහිමි වූ ආදායම රු.186,850,808 කි. මෙලෙස ඉහත සඳහන් පරිදි කොමිෂන් සභාවේ පැවැත්මට ඇති ප්‍රධානම ආදායම් මාර්ගය විකල්ප යෝජනා වලින් තොරව මුළුමනින්ම අය නොකිරීමට තීරණය කිරීමෙන් ඉදිරි වර්ෂවල ආයතනයේ ඉදිරි පැවැත්මට බාධාවක් ඇතිවීමේ ඉඩකඩ පවතින බව නිරීක්ෂණය විය.

(ආ) කොමිෂන් සභාවට අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ආයෝජන මගින් සපුරා ගැනීමේදී ඒ සඳහා සුදුසුම ආයෝජන හඳුනා නොගැනීම නිසා ඒ මත ලැබිය යුතු පොළී ආදායම් දිගින් දිගටම අඩුවී තිබුණි.

(ඇ) බස් රථ මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන GPS පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් 2020 වර්ෂය තුලදී රු.6,642,350 ක වියදමක් දරා තිබුණු නමුත්, සේවා ආදායමක් ලෙස වර්ෂය තුලදී රු.2,047,500 ක් පමණක් අයකර තිබුණි. ඒ අනුව GPS පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් කොමිෂන් සභාවට රු.4,594,850 ක අතිරේක වියදමක් දැරීමට සිදුවී තිබුණි. බස් රථයකින් අයකරනු ලැබූ සේවා ගාස්තුව වූ රු.3,000 ක මුදල සමාලෝචිත වර්ෂය තුලදී රු.1,500 දක්වා සියයට 50 කින් අඩු කිරීම මෙයට හේතු වී තිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) කොමිෂන් සභාවෙන් බස් සමාගම් වෙත නිකුත් කර ඇති කාර්යාල උපකරණ හා පරිගණක උපාංග අයිතම් ඒකක 117 ක් සමීක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද කොමිෂන් සභාවේ සියලු වත්කම් සඳහා හඳුනාගැනීමේ අංකයක් යොදා නොතිබුණි. එසේ අංකයක් නොමැති අයිතම 519 ක් සමීක්ෂණයට ඉදිරිපත් කර තිබුණි. කොමිෂන් සභාවේ සමීක්ෂණ වාර්තාව අනුව අයිතම ඒකක 67 ක් සමීක්ෂණයේදී හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් 2020 වසර තුල ටෙන්ඩර් මගින් නව බලපත්‍ර නිකුත් කිරීම වෙනුවට දෛනික පදනමින් බලපත්‍ර නිකුත් කිරීම නිසා ලැබිය යුතු ආදායමක් අහිමිවී තිබුණි. තවද මෙම හේතුව නිසා වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව තිබූ බස්රථ 3040 ක සංඛ්‍යාවකින් GPS පද්ධති සවි කිරීමට හැකියාව ලැබී තිබුණේ බස්රථ 1159ක් හෙවත් සියයට 38ක සංඛ්‍යාවකට පමණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

8

**ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාපිළිබඳව2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු පහත සඳහන් වේ.**

**1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම**

(අ) පෙර වර්ෂයට අදාල ක්ෂය වටිනාකම රු. 1,139,058 ක් නොව, රු. 139,058.05 ක් පමණක් වන අතර,එය ප්‍රවර්තන වර්ෂයේ ක්ෂය වියදමෙන් ඉවත් කිරීම අතපසුවීමකින් සිදුවී ඇත. 2021 වසරේ මූල්‍ය ප්‍රකාශණ පිලියෙල කිරීමේදී අදාල වරද නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ආ) විශේෂ ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ වැය කරන ලද වියදම් වල ඇතුලත් වත්කම් ලෙස හඳුනා ගන්නා ලද වටිනාකම ප්‍රාග්ධනිත කර ඇති අතර, ඉතිරි වියදම ආදායම් වියදම් ප්‍රකාශණයේ දක්වා ඇත.

**2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

(අ) අදාළ විස්තර සහිතව වත්කම් ලේඛනය පිලියල කරමින් පවතී.

i තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යංශය මගින් ඉල්ලීම් කර ඇත. (අදාල ලිපියේ පිටපත විගණකාධිපතිගේ අංක ආර්ටී/බී/එන්ටීසී/එෆ්ඒ/2012/22 දරන විමසුමට පිළිතුරු සමග විගණනය වෙත ඉදිරිපත් කර ඇක. ) එසේ වුවත් 2012 අගෝස්තු මස 22 වන දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාවේදී, කෙටි කාලීන අතිරික්ත අරමුදල් සත් දින කැඳවුම් තැන්පතු වල ආයෝජනය කරනවා වෙනුවට යම් කොටසක් වැඩි පොළී ආදායමක් ලැබීම සඳහා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරන මෙන් උපදෙස් ලැබී ඇත.

(රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභා රැස්වීම් සටහන් වල පිටපතක් අංක ආර්ටී/බී/එන්ටීසී/ එෆ්ඒ/ 2012/22 දරන විමසුමට පිළිතුරු සමග විගණනය වෙත ඉදිරිපත් කර ඇක. )

එයට අමතරව තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ප්‍රවාහන සේවා කළමණාකරන අමාත්‍යාංශය මගින් කිහිපවරක්ඉල්ලීම් කර ඇති අතර

2019.02.07 දිනැතිවද ඉල්ලීමක් කර ඇති අතර මේ දක්වා එයට ද පිළිතුරක් ලැබී නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි.

ii ප්‍රවාහන අමාත්‍යංශයෙන් ලද MT/01/05/05/01අංක දරන හා 2020.09.28 දිනැති ලිපියට අනුව ඉන්දිකා ලක්මාලි මහත්මිය 2020.10.12 දින සිට ප්‍රවාහන අමාත්‍යංශයේ ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ සහාය කාර්ය මණ්ඩලය වෙත නිදහස් කර ඇත.

iii ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවකයින් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට දායක කර ඇත. එය රජයේ සේවකයින් සඳහා ක්‍රියාත්මක රක්ෂණාවරනයක් වේ. මේ සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඇත. එමෙන්ම ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනත මගින් සේවක සුභසාධනය සඳහා අනුග්‍රහය දැක්වීමට අවස්ථාව ලබා දී ඇත.

iv අදාල කාර්යයන් ණය පදනම මත සිදු කර ගැනීමට නොහැකි වූ බැවින් එම මුළු මුදලම චෙක්පත් මගින් අත්තිකාරම් ලෙස ගෙවීමට සිදුවිය. එමෙන්ම රටේ එවකට පැවති COVID වසංගත තත්වය මත විවිධ සේවා සපයන්නන්ගේ බිල් පත් සඳහා අත්තිකාරම් මුදලක් ගෙවා පසුව නිසි පරීක්ෂාවකින් පසු ඉතිරි මුදල ගෙවීමට සිදුවිය. කෙසේ වුවද සේවක සුභසාධන කටයුතු සඳහා ගෙවීම් කිරීමේදී අවම මුදල් අත්තිකාරම් ලබා දීමට සටහන් කර ගන්නා ලදී.

**2.2.3** ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය 2020 නොවැම්බර් මස අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමුකර අනුමැතිය ලබාගෙන ඇති අතර එහි ඉදිරි කටයුතු කිරීමට මේ වනවිට නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

**2.2.4** කොවිඩ් 19 වසංගතය දිවයින පුරා ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා 2020 මාර්තු මස මැදදී නිරෝධායන ඇඳිරි නීතිය හා අගුළු දැමීම දිවයින පුරා ක්‍රියාත්මක වූ අතර, පසුව එම තත්වය පළාතෙන් පළාතට ක්‍රමක්‍රමයෙන් ලිහිල් කරන ලදී

නිරෝධායන ඇඳිරි නීතිය හා අගුළු දැමීම් හේතුවෙන් අන්තර් පළාත් බස්රථ ධාවන කටයුතු සම්පූර්ණයෙන්ම අඩපණ විය. එසේම පළාත් වශයෙන් නිරෝධායන ඇඳිරිනීතිය ලිහිල් කලද අන්තර් පළාත් බස් රථ පළාත් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර ධාවනය වන බැවින් ඒ සඳහා අවස්ථා හිමි නොවීය. ඒ අනුව අන්තර් පළාත් බස්රථ සේවා ආරම්භ කිරීම 2020 ජුනි මස මුල් සතියේ පමණ සිදු වුවත් බස් රථ වල ගමන් කරන මගීන්ගේ විශාල අඩු වීමක් සිදුවූ නිසා බස් රථ සාමාන්‍ය පරිදි ධාවනය නොවූ අතර ධාවනය කරන ලද බස් රථ වල ගමන් කරනු ලැබුවේ අඩු මගීන් සංඛ්‍යාවකි.

මෙවැනි තත්වයක් තුළ බස්රථ ධාවන කටයුතු යථා තත්වයට පත් වන තෙක් තමන්ට සහන ලබා දෙන ලෙසට බස්රථ සංගම් වලින් හා මගී සේවා අවසර පත්‍ර හිමියන්ගෙන් ඉල්ලීම් ඉදිරිපත් විය.

ඒ අනුව බස් රථ ධාවනය නොවූ කාලය සඳහා එනම් 2020 මාර්තු, අප්‍රේල්, මැයි මාස වලදී මගී සේවා අවසරපත්‍ර යාවත්කාලීන කිරීමේ ගාස්තු , ටෙන්ඩර් ගාස්තු , අධිවේගී මාර්ගයේ තාවකාලික අවසර පත්‍ර ගාස්තු , ලොග් පත්‍ර ගාස්තු හා ප්‍රමාද ගාස්තු නිදහස් කිරීමට 49/2020 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලැබී ඇත. එසේම බස්රථ ධාවන කටයුතු ජූනි මස ආරම්භ වුවත් එම අවස්ථාව වන විටත් ධාවන කටයුතු යථා තත්වයට පත් නොවී තිබූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 51/2020 මගින් හා 120/2020 මගින් සැප්තැම්බර් මාසය දක්වාද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිණ.

අතිගරු ජනාධිපතිතුමා සමග හා ගරු අමාත්‍යතුමා සමග පැවති සාකච්ඡාවේදී බස්රථ හිමියන්ට කඩිනමින් සහන ලබා දීමට ලබාදුන් උපදෙස් අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ සහන ලබා දීමට කටයුතු කර ඇත. 2020 ඔක්තෝබර් මුල් සතියේ බ්‍රැන්ඩික්ස් දෙවැනි කොවිඩ් රැල්ල ආරම්භ වීමත් සමග බස්රථ ධාවන කටයුතු යලි අඩපණ වූ බැවින් බස්රථ සංගම් වල ඉල්ලීම් මත තවදුරටත් සහන ලබා දීමේ අවශ්‍යතාවක් මතු විය.

එසේම 2020 මාර්තු මස සිට සැප්තැම්බර් දක්වා වූ කාලය සඳහා මෙන්ම ඔක්තෝබර් සිට දෙසැම්බර් මස දක්වා වූ කාලය සඳහා සහන ලබාදීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇත. බස් රථ හිමිකරුවන්ගෙන් නිසි පරිදි ගාස්තු අය කිරීමට කටයුතු සැලසුම් කර තිබූ හෙයින් කල්තියා අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබා ගැනීමට කටයුතු නොකළ අතර අවස්ථානුකූලව ඇතිවීඇති තත්වයන් සලකා බලා අත්‍යවශ්‍ය සේවාවන් ලෙස ප්‍රවාහන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණෙන් සහන ලබා දීමට කටයුතු කර ඇත.

(ආ) covid 19 වසංගත තත්වය හේතුවෙන් ඇතිවූ අනපේක්ෂිත කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මත ආයෝජන කල්පිරීම් පදනම මත ආපසු ගැනීමට සිදු වූ අතර අතිරික්තය නැවත ආයෝජනය කරන ලදී. නැවත ආයෝජනයේදී පොලී ප්‍රතිශතය අඩු අගයක් ගත් බැවින් ලැබිය යුතු පොලී ආදායමෙහි අඩුවක් සිදු වන ලදී.

(ඇ) GPS පාලන මැදිරිය හා සිම්පත් සඳහා මුදල් අයකර ගැනීම යනු කාරණා දෙකක් වන අතර සිම්පත් සඳහා අය කරනු ලබන මුදල් GPS පාලන මැදිරිය නඩත්තු කිරීම සඳහා යෙදවීමට කිසිදු අරමුණක් හෝ සැලසුමක් මෙමව්‍යාපෘතිය තුල නොමැත. සිම්පත් සඳහා අය කරනු ලබන රුපියල් 1500.00 ක මුදලින් එම සිම්පත් සඳහා වාර්ෂිකව වැයවන රුපියල් 1440.00 ක පමණ මුදල පියවා ගැනීමට කටයුතු කරනු ලැබේ GPS පාලන මැදිරිය යනු සමස්ත අන්තර් පළාත් බස්රථ සියල්ල නියාමනයට ස්ථාපනය කරන ලද්දක් වන අතර එය ආදායම් ඉපයීමට නොව පොදු සේවාවක් සැපයීමට පමණක් අරමුණු වූවකි.මෙම පාලන මැදිරිය හරහා ශ්‍රී ලංගම හා පළාත් ප්‍රවාහන බස්රථද සම්බන්ධ කිරීමට යෝජනා වී ඇත. එබැවින් සිම්පත් වලින් ලැබෙන ආදායම පාලන මැදිරිය නඩත්තු වියදම් හා ගැලපීම සිදු කල නොහැක.

## 2.3 වෙනත් කරුණු

(අ) වත්කම් අංක වත්කම මත සටහන් නොකරන ලද සියලුවත්කම් හදුනාගෙන අදාළ අංක වත්කම් වල සටහන් කිරීමට මේ වනවිට කටයුතු යොදා ඇත

(ආ) 2020 වර්ෂය තුළ ටෙන්ඩර් ක්‍රමය මගින් නව මගී සේවා අවසරපත්‍ර නිකුත් නොකරන ලදි. 2020 වර්ෂයේ මාර්තු මස සිට කොරෝනා වසංගතය දිවයින පුරා පැතිරීමත් සමඟ බස් රථ සඳහා මගී ඉල්ලුම පහත යාම හේතුවෙන් ටෙන්ඩර් ක්‍රමයට නව මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමේ අවශ්‍යතාවක් පැන නොනැගුණි.

GPS යන්ත්‍ර සවි කිරීම පිළිබඳ විමසුමේ සඳහන් කරුණු වලට එකඟවේ

241, උද්‍යාන පාර, කොළඹ 05.
241, பூங்கா வீதிஇ கொழும்பு 05
241, Park Road, Colombo 05